SuR: **Sri Lanka**

42nd session of the Submission to the Universal Periodic Review

# Situation of LGBTI+ persons in Sri Lanka

Joint NGO Submission to the Universal Periodic Review

by

Équité Sri Lanka, Bridge for Equality, Rajarata Gemi Pahana

# සිංහල පරිවර්තනය

පටුන


**1.** හැඳින්වීම ........ 33

**4.** නෛතික සහ ප්‍රතිපත්ති සන්දර්භය ........ 35

**5.** පොලිසිය විසින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම සහ අමානුෂික, පහත් ලෙස සැළකීම. ........ 36

**6.** ගෘහස්ථ හිංසනය සහ නිවාස අහිමිවීම. ........ 38

**7.** සෞඛ්‍යය ක්ෂේත්‍රය තුළ අපකීර්තිය සහ වෙනස්කොට සැළකීම. ........ 39

**8.** අධ්‍යාපන ආයතනවල වෙනස්කොට සැළකීම සහ හිරිහැර කිරීම. ........ 42

**9.** අනෙකුත් රාජ්‍ය නිළධාරීන් විසින් වෙනස් කොට සැළකීම. ........ 42

**10.** රැකියා සම්මුඛ පරීක්ෂණ සහ සේවා ස්ථානවල වෙනස්කොට සැළකීම. ........ 43

**11.** දේශපාලන සමරිසි භීතිකාව ........ 44

**12.** **LGBTI+** ගැටළු වාර්තා කිරීමේදී මාධ්‍ය ආචාර ධර්ම සම්බන්ධ ගැටළු ........ 45

**13.** මානව හිමිකම් ක්‍රියාකාරීන් මුහුණ දෙන පළිගැනීම් සහ හිරිහැර ........ 45

**14.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ........ 47

**15.** නිර්දේශ ........ 48

**16.** සිදුවීම් සම්බන්දව ඇමිණුම ........ 50

## 1. හැඳින්වීම

**ශ්‍රී ලංකාව තුළ LGBTI+ ප්‍රජාවේ තත්ත්වය ආවරණය කරමින් Équité Sri Lanka සමඟ සිවිල් සමාජ සංවිධාන එකමුතුව විසින් මෙම වාර්තාව ඉදිරිපත් කිරීම කරනු ලැබේ. රටේ සමකාලීන දේශපාලන සන්දර්භය තුළ, ජනතාවගේ අයිතිවාසිකම් විශාල ලෙස අභියෝගයට ලක් වී ඇති අතර, වර්තමානයේ පවතින තත්ත්වයන් රට තුළ ආරක්ෂිත ජීවන තත්ත්වයකට පහසුකම් සැපයෙන්නේ නැත. එබැවින් ආන්තික ප්‍රජාවක් ලෙස, පවතින සමාජ ආර්ථික දේශපාලන තත්ත්වයන් තුළ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ අයිතිවාසිකම් බොහෝ ස්ථරවලින් අභියෝගයට ලක් වේ**

## 2. ක්‍රමවේදය

මෙම වාර්තාව සැකසීමේදී, ඉක්විටි ශ්‍රී ලංකා (Equité Sri Lanka) සංවිධානය විසින් 2022 මාර්තු මස සිට 2022 ජුනි මස දක්වා කාලය තුළ දිවයින පුරා LGBTI+ පුද්ගලයින් 125 දෙනෙකු සමඟ දිස්ත්‍රික් මට්ටමේ සාකච්ඡා පැවැත්වීය. මෙම සාකච්ඡා සඳහා සහභාගිවන්නන් බොහෝ දුරට තෝරාගනු ලැබුවේ මෙම ඉදිරිපත් කිරීම සිදුකරන සංවිධාන ජාලය හරහාය. වත්මන් විශ්ව කාලාන්තර සමාලෝචන (UPR) චක්‍රයේ කාලසීමාව කෙරෙහි අවධානය යොමු කරමින් 2018 වසරෙන් පසු LGBTI+ පුද්ගලයන් මුහුණ දෙන අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳව පැවැත්වූ වැඩමුළු හරහා සාකච්ඡා කෙරිණි. මෙම සාකච්ඡා තේමා ක්ෂේත්‍ර පහක් ආවරණය කළේය.

- ගෘහස්ත හිංසනය,
- සේවක අයිතිවාසිකම්,
- නීතිය සහ යුක්තිය සහ නීති සේවා සඳහා ප්‍රවේශය,
- කායික, මානසික සහ ලිංගික සෞඛ්‍ය සම්බන්ධ සේවාවන් සඳහා ප්‍රවේශය, සහ
- LGBTI+ පුද්ගලයන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රැස්වීමේ සහ සමාගමයේ නිදහස සහ අනෙකුත් අයිතිවාසිකම් සහ අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ සැළකිය යුතු කරුණු.

මීට අමතරව, Bridge to Equality සහ රජරට ගැමි පහන යන සංවිධාන ආයතනික මට්ටමින් එකතු කරන ලද අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ සිදුවීම් මෙම වාර්තාව සඳහා එකතු කිරීමෙන් දායක වී ඇත. එසේම විවිධ මාධ්‍ය වාර්තා, ලේඛනගත සිද්ධි අධ්‍යයන සහ ප්‍රකාශිත වාර්තා මෙම වාර්තාව සකස් කිරීමේදී යොදා ගෙන ඇත. මෙම වාර්තාව සකස් කිරීමේදී භාවිතා කරන ලද සිද්ධි අධ්‍යයන ලැයිස්තුවක් ඇමුණුමක් ලෙස අමුණා ඇත.

## 3. ජාත්‍යන්තර සහයෝගය සහ මින් පෙර සමාලෝචන

2017 වර්ෂයේ නොවැම්බර් මස පැවති විශ්ව කාලාන්තර සමාලෝචන රැස්වීමේ දී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිබිඹු වන සමානාත්මතාවයට සහ වෙනස් කොට සැලකීමට ඇති පොදු අයිතියට ලිංගික දිශානතිය පදනම් කොට ගත් වෙනස්කොට නොසැළකීම ව්‍යංගයෙන් ඇතුළත් කර ඇති බව සඳහන් කළ අතර, ඔවුන් එම අයිතිවාසිකම් ලබා දීමට අදහස් කරන බව ද ප්‍රකාශ කළේය. සමානත්වයට හා වෙනස්කොට නොසැලකීමට අදාළ සාමාන්‍ය අයිතිවාසිකම් පවතින ව්‍යවස්ථාවෙන් ආවරණය වන බව ප්‍රකාශ කළ අතර ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන වෙනස්කොට සැලකීම් වැළැක්වීම සහතික කිරීම සඳහා ඉදිරියේදී සිදුකරන ව්‍යවස්ථා සංශෝධන යොදාගන්නා බව දක්වන ලදී. (A/HRC/37/17, ඡේදය 82).

ව්‍යවස්ථාව මගින් ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් නොකිරීමේ සහතිකය 2014 සිට විවිධ ජාත්‍යන්තර සංසදවලදී සිදු කර ඇත. (උදාහරණයක් ලෙස, 2014 දී ICCPR සමාප්ති නිරීක්ෂණ යටතේ 'වෙනස් කොට නොසැළකීම' කොටස බලන්න). කෙසේ වෙතත්, LGBTI+ පුද්ගලයන්ට එරෙහිව අඛණ්ඩව අයිතිවාසිකම් උල්ලංඝනය වන රටාවක් අපි දකිමු, එය වසර ගණනාවක් පුරා ආමන්ත්‍රණය කිරීමට හෝ විසඳුම් සෙවීමට රජය කිසිදු නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

3.1. විශ්ව කාලාන්තර සමාලෝචනයෙහි අවසාන චක්‍රයේ, LGBTI + ප්‍රජාව සම්බන්ධව "සහය දැක්වීමට" (Supported) ශ්‍රී ලංකා රජය එකඟ වූ නිර්දේශ දෙක වූයේ (1) විශේෂයෙන් ජනවාර්ගිකත්වය සහ ලිංගික දිශානතිය යන හේතු මත සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් වැළැක්වීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම (ඉතාලිය) සහ (02) සමරිසි කාන්තා, සමරිසි පිරිමි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ මූලික නිදහසට ගරු කිරීම සහතික කිරීම, එවැනි පුද්ගලයන්ට එරෙහි වෙනස්කොට සැළකීම සහ ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය කිරීම (ආර්ජන්ටිනාව) පමණි. (A/HRC/37/17 - ඡේදය 116)

3.2. කැමැත්තෙන් සිදුවන සමරිසි සම්බන්ධතා නිර්සාපරාධිකරණය කිරීම මෙන්ම දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් 'Noted' ලෙස එනම් දැනුවත් වූ ලෙස හෝ එය සළකා බැලිය හැකිය යනුවෙන් සඳහන් කර ඇත. (හොන්ඩුරාස්, නෙදර්ලන්තය, බ්‍රසීලය, කැනඩාව, ස්වීඩනය, උරුගුවේ, ඕස්ට්‍රේලියාව A/HRC/37/17 - ඡේදය. 117)

3.3. ශ්‍රී ලංකා රජය විසින් 'Noted' ලෙස එනම් දැනුවත් වූ ලෙස හෝ එය සළකා බැලිය හැකිය යනුවෙන් සඳහන් කරන ලද හොන්ඩුරාස් රාජ්‍යය විසින් කරන ලද නිර්දේශයේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව වෙනස් කොට සැළකීම සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග අනුගමනය කිරීමටත්, සමරිසි කාන්තා, සමරිසි පිරිමි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට සෞඛ්‍යය සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කිරීමටත් යෝජනාවක් ඇතුළත් විය. (A/HRC/37/17 - ඡේදය 117)

3.4. 2017 මාර්තු මාසයේදී, ශ්‍රී ලංකාවේ අටවන සමාලෝචන වාර්තාව පිළිබඳ අවසාන නිරීක්ෂණ ලෙස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනස්කොට සැළකීම නොකිරීමේ පදනමක් ලෙස ලිංගික දිශානතිය සහ ලිංගික අනන්‍යතාවය විශේෂයෙන් ඇතුළත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටුවේ රාජ්‍ය පාර්ශවයේ යෝජනාව ද CEDAW සඳහන් කරයි. (CEDAW/C/LKA/CO/8, ඡේදය 10).

3.5. බොහෝ ලෙස පොරොන්දු වූ නව ව්‍යවස්ථාව ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත වෙනස්කම් නොකිරීමේ පැහැදිලි සහතිකයක් ඇතුළත් කිරීමට අපේක්ෂා කළ නමුත් (A/HRC/WG.6/28/LKA/1, ඡේදය 14, ඡේදය 33, ඡේදය 137) එවැනි ප්‍රතිසංස්කරණවලට උත්සාහ කළ අවස්ථා අසාර්ථක විය. 2020 දී පත් කරන ලද ශ්‍රී ලංකාවේ වත්මන් රජය විසින් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු නොකළ බැවින් යථාර්ථයක් බවට පත් නොවීය.

## 4. නෛතික සහ ප්‍රතිපත්ති සන්දර්භය

4.1. ශ්‍රී ලංකාව තුළ, යටත් විජිත සම්භවයක් ඇති සොදොම් නීති යටතේ විශේෂයෙන්ම 1883 දී බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ සමරිසි සබඳතා අපරාධයක් බවට පත් කර ඇත. දණ්ඩ නීති සංග්‍රහයේ යටතේ දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන 365, 365A වගන්ති සහ 1841 දී හඳුන්වා දුන් අයාල ආඥා පනත වැඩිහිටියන් අතර සමරිසි සබඳතා අනුමත කිරීම අපරාධයක් බවට පත් කරයි. දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය: සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් සහ හරස් විලාසිතා කරන පුද්ගලයන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමට බොහෝ විට යොදාගෙන ඇත. (වෙනත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටීම) ප්‍රතිරූපණයෙන් වංචා කිරීමයි. ත්‍රිවිධ හමුදාවේ සේවය කරන LGBTI+ පුද්ගලයන්ට නඩු පැවරීමට ද ත්‍රිවිධ හමුදාවට අදාළ විශේෂ නීති භාවිතා වේ..

4.2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඇති මූලික අයිතිවාසිකම් නීතියේ සීමිත විෂය පථය LGBTI+ පුද්ගලයන්ට වෙනස් කොට සැළකීමට ද බලපෑමක් ඇති කරයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තිය මගින් මූලික අයිතිවාසිකම් හෝ වෙනත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන උල්ලංඝනය කිරීමකදී පවා පවතින නීතිවලට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීමට අවසර නැත. එසේම මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කළ හැක්කේ පුද්ගලික පාර්ශවයන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීම වළක්වාලමින් පරිපාලන හා විධායක ක්‍රියාමාර්ග මගින් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හෝ අත්‍යාසන්න අවස්ථාවක දී එයට එරෙහිව පමණි.

4.3. 2020 ඔක්තෝම්බර් මාසයේදී යෞවන හා ක්‍රීඩා අමාත්‍යාංශය ප්‍රමුඛ කමිටුවක් විසින් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිසංස්කරණ පිළිබඳ යෝජනා සොයා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලදී. යෝජිත දණ්ඩ නීති සංග්‍රහ ප්‍රතිසංස්කරණ මගින් LGBTI+ පුද්ගලයන්ට බලපාන නීති ඇතුළුව ලිංගික අපරාධ සම්බන්ධ නීති මාලාවක් ආවරණය කිරීමට අපේක්ෂා කෙරිණි. යෝජිත සංශෝධන මගින් පොදු ස්ථානයන් හි ලිංගික ක්‍රියාකාරකම් සාපරාධීකරණයට අවසර දෙන අතරම පුද්ගලික අවකාශයන්හි සමරිසි සබඳතා සාපරාධී නොවන ලෙස යෝජනා කරන ලදී. එවැනි සංශෝධන මගින් පොදු අවකාශයන්හි යැයි කියනු ලබන ලිංගික ක්‍රියාකාරකම් යටතේ දැනට පවතින නඩු පැවරීම්වලින් බහුතරයකට අවධානය යොමු වනු ඇත, LGBTI+ පුද්ගලයින් ලිංගික ක්‍රියාකාරකම් සඳහා බහුලව ගැවසෙන ස්ථාන (cruising areas) වල දී වෙනස් කොට සැළකීමට ලක් වනු ඇත, එමෙන්ම පුද්ගලික හෝටල් හෝ කාමර සඳහා ඔවුන්ට මිල ගණන් දැරිය නොහැකි වනු ඇත..

4.4. 2020 ජූනි මාසයේදී නාරාහේන්පිට (කොළඹ) පොලිසිය විසින් පෞද්ගලික හෝටලයක් වටලා අත්අඩංගුවට ගත් සමරිසි පුරුෂයන් තිදෙනෙකුට එරෙහිව පවරා තිබූ නඩුවක් 2021 දෙසැම්බර් මාසයේදී කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා විසින් නිෂ්ප්‍රභා කළේය. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ කිසියම් ලිංගික ක්‍රියාකාරකමක යෙදී සිටි බව කියන සමරිසි ලිංගික හැසිරීම් සම්බන්ධයෙන් ඔවුන්ට චෝදනා එල්ල වී තිබේ. ඔවුන් අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිස් වධ හිංසාවලට සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන් (JMOs) විසින් බලහත්කාරයෙන් ගුද මාර්ග පරීක්ෂණවලට ලක් කර ඇත. අංක 34131/3/20 දරන නඩුව නිෂ්ප්‍රභා කිරීමට පදනම් වී ඇත්තේ

නීතිපතිවරයා විසින් මෙම නඩුව විභාග නොකරන බවට පොලිසියට දන්වා තිබූ ලිපියක් පදනම් කරගෙනය.[1]

5. **පොලිසිය විසින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම සහ අමානුෂික, පහත් ලෙස සැළකීම.**

5.1. Équité Sri Lanka විසින් සංවිධානය කරන ලද ප්‍රජා රැස්වීම්වලදී ප්‍රජා සාමාජිකයින් විසින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීමේ සිදුවීම් ගණනාවක් වාර්තා වූ අතර ඉන් කිහිපයක් මාධ්‍යවල ද වාර්තා විය. නමුත් බොහෝ අවස්ථාවල මෙම සිද්ධීන් සම්බන්ධයෙන් විධිමත් පැමිණිලි ඉදිරිපත් වී නොමැත්තේ වින්දිතයන්ගෙන් පළිගැනීමේ බිය නිසා ය.

5.1.1. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රජා සාමාජිකයන් සමග සාකච්ඡාවේ දී ලිංගික ශ්‍රමිකයන් ලෙස සේවය කරන සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් පස් දෙනෙකු ප්‍රකාශ කළේ තමන් අවස්ථා කිහිපයකදී පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන අසත්‍ය චෝදනා යටතේ රඳවා තබාගෙන විවිධ හිංසනයන්ට ලක් කර ඇති බවයි. පොලිසියේ නිළධාරීන් ඔවුන් සමග බලහත්කාරයෙන් ලිංගිකව හැසිරුණු අවස්ථා ඇති බවත් ඔවුන්ගේ මුදල් සහ ජංගම දුරකථන පොලිස් භාරයට ගත් බවත් ඔවුන් සඳහන් කළේය.. ඔවුන් වැඩිදුරටත් චෝදනා කළේ තමන් පිරිමි ද ගැහැණු ද යන්න පරීක්ෂා කර බැලීමට සහ බොහෝ විට අමානුෂික, අවමන් සහගත සැළකිලිවලට ලක්වන ලෙස සියලු දෙනා ඉදිරියේම පොලිසියේදී නිරුවත් වීමට බල කළ බවයි.

5.2. 2022 ජූනි මාසයේදී, ශ්‍රී ලාංකික සහ ඉන්දියානු සමරිසි කාන්තා යුවළක් පිළිබඳ ශ්‍රී ලංකික කාන්තාව ගේ පවුලේ සාමාජිකයන් ඔවුන්ගේ සමරිසි සම්බන්ධතාවය පිළිබඳ පොලිසියට පැමිණිලි කිරීමෙන් පසු, ඉන්දියාවට යාමට සැලසුම් කර ඇති ඉන්දියානු සහ ශ්‍රී ලාංකික සමරිසි කාන්තා යුවළ අත්අඩංගුවට ගන්නා ලදී. ඔවුන් අක්කරෙයිපත්තුව මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කළ අතර එහිදී ඔවුන් දෙදෙනා මනෝ වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ඔවුන් පිළිබඳ මනෝ වෛද්‍ය වාර්තාවක් සකස් කරන ලෙස නියෝග කළේය.

5.3. 2021 නොවැම්බර් මාසයේදී, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් හය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සවස 6.30 ට පමණ ත්‍රිකුණාමලය වෙරළ තීරයේ සිටියදී, ජීප් රථයෙන් ප්‍රදේශයේ මුර සංචාරයේ යෙදී සිටි පොලිස් නිළධාරීන් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රකාශනය සහ ඔවුන් ලිප්ස්ටික් සහ මේකප් වලින් සැරසී සිටි නිසා ජීප් රථයෙන් රැගෙන ගොස් ඔවුන් පැය 3 ක් රඳවාගෙන ඇත. ලිංගික ක්‍රියාකාරකම් වල යෙදෙන බවට පොලිසිය ඔවුන්ට චෝදනා කර ඇති අතර නැටුම් ගැයුම් වලින් පොලිස් නිළධාරීන්ව පිනවන ලෙස නිලධාරින් විසින් ඉල්ලා තිබේ.

5.4. 2020 මැයි 17 වන දින ගම්පහ ප්‍රදේශයේ සමරිසි පුද්ගලයෙකු සියඹලාපේ ප්‍රදේශයේ ඇති ඇවිදින මංතීරුවේදී ව්‍යාජ චෝදනාවක් මත පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඔහු 'සමරිසි' නිසා පොලිසිය විසින් ලිංගික අපයෝජනයට ලක් කර ප්‍රසිද්ධියේ අවමානයට ලක් කර ඇත.

5.5. 2022 මාර්තු 18 වන දින පොළොන්නරුවේ පදිංචි සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් කොන්ඩම් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් කොළඹ මරීනා සාප්පු සංකීර්ණය ඉදිරිපිටදී පොලිසිය විසින්

[1] HTTPS://WWW.DAILYMIRROR.LK/BREAKING_NEWS/COLOMBO-CHIEF-MAGISTRATE-DISMISSES-CASE-AGAINST-THREE-GAY-MEN-FOR-HOMOSEXUALITY/108-226559

අත්අඩංගුවට ගන්නා ලදී. ඇයව පිරිමි සිර මැදිරියට ඇතුළත් කර ඇති අතර, කාන්තා සිරමැදිරියට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටි විට, පොලිසිය ඇයගේ ලිංගික අවයව පරීක්ෂා කර, ඇයගේ ලිංගික අනන්‍යතාවය සහ ප්‍රකාශනය සම්බන්ධයෙන් අවමානයට ලක් කර හා අපහාස කර ඇත.

5.6. පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම් සහ හිරිහැර කිරීම් සාමාන්‍ය දෙයක් වුවද, LGBTI + ප්‍රජා සාමාජිකයින් බොහෝ විට තමන් මුහුණ දෙන හිංසනයන් සහ අයිතිවාසිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් නීතිමය ආයතනවලට පැමිණිලි නොකරන්නේ, ඔවුන් නිළධාරීන්ගෙන් පළිගැනීම්වලට මුහුණ දෙනු ඇතැයි යන බිය නිසා ය. සමරිසිභාවය දණ්ඩ නීති සංග්‍රය යටතේ සාපරාධීකරණය කිරීම සහ සමරිසි ප්‍රජාව සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ ආකල්ප එවැනි පැමිණිලි කිරීමට ඇති උනන්දුව අඩුවීම පිටුපස ඇති ප්‍රධාන හේතු අතර වේ.

5.7. එසේම LGBTI+ පුද්ගලයන් විසින් තමන් මුහුණ දුන් හිංසන සහ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි වෙනත් සිද්ධීන් නිසා පොලිසිය විසින් පිළිගෙන නොමැති බව අපට දන්වා ඇත.

5.7.1. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රජා සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේ දී ඇතැම් ලිංගික වෘත්තියේ යෙදෙන සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව පොලිසියට චෝදනා කළේ නිළධාරීන් විසින් මත්ද්‍රව්‍ය දමා අත්අඩංගුවට ගැනීමට සාක්ෂි -නිර්මාණය කරන බව සහ ඒ  අතර තමන්ට මුහුණ දීමට සිදුවන මෙවැනි හිරිහැර හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තමන් බිය වන බවයි.

5.8. ලිංගික වෘත්තියේ යෙදෙන ප්‍රජාවන් වැනි බොහෝ අඩු වරප්‍රසාද ලත් කණ්ඩායම් නීතිය ක්‍රියාත්මක කරන්නන්ගෙන්  ඔවුන්ට මුහුණ දීමට සිදුවන දෛනික අයිතීන් උල්ලංඝනය කිරීම්වලට එරෙහිව යුක්තිය නොපැතීමට තවත් හේතුවක් වන්නේ උසාවි වාර ප්‍රමාදයන් සහ නීතිමය කටයුතු සඳහා වියදම් දැරීමට නොහැකි වීමයි. ඉහත සඳහන් කළ පරිදි, බන්ධනාගාරයේ සහ සිර මැදිරි බෙදීම් සහ සැකසුම් තුළ වලදී  ලිංගිකත්වය පිළිබඳ විවිධත්වය හඳුනා නොගැනීම නිසා  අත්අඩංගුවට ගන්නා LGBTI+ පුද්ගලයින් සිර මැදිරි තුළ දී තවදුරටත් හිංසනයන්ට ලක් කිරීමට හේතු වේ.

5.9. LGBTI+ පුද්ගලයන් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව අත්අඩංගුවට ගැනීමෙන් පසු බලහත්කාර වෛද්‍ය පරීක්ෂණවලට ලක් කිරීම ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සහ අභිමානය උල්ලංඝනය කරයි.

5.9.1. 2020 ඔක්තෝම්බර් මාසයේදී, Equal Ground and Human Rights Watch විසින් ප්‍රකාශයට පත් කළ වාර්තාවට අනුව, සමරිසි හැසිරීම් පිළිබඳ සාක්ෂි සෙවීම සඳහා ශ්‍රී ලංකා බලධාරීන් 2017 වසරේ සිට අවම වශයෙන් පුද්ගලයින් හත් දෙනෙකුට බලහත්කාර ශාරීරික පරීක්ෂණවලට ලක් කර ඇත. මෙම පරීක්ෂණ වලට බලහත්කාර ගුද පරීක්ෂණ සහ බලහත්කාර යෝනි පරීක්ෂාව ඇතුළත් විය. ඊට ප්‍රතිචාරයක් ලෙස, එය වහාම සොයා බැලිය යුතු "ඉක්මනින් ක්‍රියාත්මක විය යුතු හෙළිදරව්වක්" බව පවසමින් නිවේදනයක් නිකුත් කරමින් අධිකරණ අමාත්‍යවරයා කියා සිටියේ, "කිසිම පුද්ගලයකුට ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය භාවය, ලිංගිකව ඇතිවන කැමැත්ත හෝ අනන්‍යතාවය මත වෙනස් කොට

සැලකීම හෝ කිසිදු ආකාරයක අපයෝජනයක්, අපහාසයක් හෝ අසාධාරණයක් සිදු නොකළ යුතු බව දැඩි ලෙස විශ්වාස කරන බවයි.." [2]

5.9.2. වෙනත් සිද්ධීන් වලදී ද, LGBTI+ ප්‍රජාවේ පුද්ගලයන් ට ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත මනෝචිකිත්සකවරුන්ගේ නිර්දේශ සහ උපදෙස් වලට යොමු වීමට බල කොට ඇත.

## 6. ගෘහස්ථ හිංසනය සහ නිවාස අහිමිවීම.

6.1. කිසිදු නීතියක් හරහා සමරිසි සම්බන්ධතා සඳහා ප්‍රතිපාදන නොමැති අතර, 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මධ්‍යස්ථ භාෂාවක් භාවිතා කරමින් ‘සහවාසය කරන හවුල්කරුවන්’ ලෙස පිළිගෙන ඇත. කෙසේ වෙතත්, සමරිසි සහකරුවන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ බොහෝ අත්දැකීම් තිබියදීත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත භාවිතයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අවස්ථා අපට සොයාගත නොහැකි විය.

6.2. අප විසින් සිදු කළ සෑම දිස්ත්‍රික් උපදේශනයකදීම, සහභාගිවන්නන් හෙළි කළේ LGBTI+ ප්‍රජා සාමාජිකයින් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් ඔවුන්ගේ දෙමාපියන් සහ අනෙකුත් පවුලේ සාමාජිකයන්ගෙන් ගෘහස්ථ හිංසනයට බොහෝ විට ලක්වන බවයි. ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනයන්ට අමතරව, ඔවුන්ට ප්‍රජා වැඩ කටයුතුවල සහභාගීවීම , ඔවුන්ගේ වෘත්තීය සහ අධ්‍යාපන අවස්ථා හඹා යෑමෙන් ද වළක්වා ඇත.

6.2.1. අප විසින් ගම්පහ ප්‍රදේශයේ පැවති සාකච්ඡාවට සහභාගී වූවන් පස් දෙනෙකු තම පවුලේ සාමාජිකයින්ගෙන් අත්විඳින ලද කායික, මානසික සහ වාචික හිරිහැර, වෙනස් කොට සැලකීම් සහ අපකීර්තිය පිළිබඳ නිශ්චිත සිදුවීම් විස්තර කරන ලදී. එක් සහභාගිවන්නෙකුට ඔහුගේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් ඔහුගේ දෙමාපියන් විසින් නිවස හැර යාමට බල කර ඇති අතර තවත් හතර දෙනෙකු පවුලේ සාමාජිකයින්ගෙන් අත්විඳින ලද හිරිහැර හේතුවෙන් තම නිවස හැර ගොස් ඇත. ඔවුන්ගෙන් දෙදෙනෙකු ඔවුන්ගේ සහෝදර සහෝදරියන් විසින් ශාරීරික පහරදීම්වලට ලක්ව ඇත. ඔවුන්ට දෙමාපිය දේපළවලින් කිසිවක් උරුම නොවන බවත්, නිවෙස් හැර යන ලෙසත්, පවුලේ සාමාජිකයන් ජීවත් වන ප්‍රදේශයට නොඑන ලෙසට තර්ජනය කර ඇත. ඔවුන් මුහුණ දුන් ප්‍රචණ්ඩත්වය පිළිබඳව පොලිසියට පැමිණිලි කර නැති වීමට ප්‍රධාන වශයෙන් හේතු දෙකක් වන්නේ (1) පවතින නීතිමය සහන පිළිබඳව ඔවුන්ගේ නොදැනුවත්කම, (2) නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගෙන් පළිගැනීම්වලට ඇති බිය යනාදියයි

6.2.2. 2022 මැයි මාසයේදී, 22 හැවිරිදි සමරිසි කාන්තාවක් පවුලට තමන් ගැන ප්‍රකාශ කිරීමෙන් පසු පවුලේ සාමාජිකයන් විසින් නිවසක කාමරයක බලහත්කාරයෙන් රඳවා තබා ගන්නා ලදී. ඇයට පරිවර්තන ප්‍රතිකාර ලබා ගැනීමට බලකෙරුණු අතර නිවසින් පිටවීමට හෝ ඇයගේ රැකියාවට යාමට අවසර නොලැබුණි. පසුව ඇය තම මිතුරියක මාර්ගයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ වැලිසර මහබාගේ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර ඇත. කෙසේ වෙතත්, පොලිසිය ඇයව තවදුරටත් රඳවාගෙන සමරිසිභාවය මානසික රෝගයක් බව පවසමින් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කරන ලෙස පවුලේ ඥාතීන්ට දන්වා ඇත්තේ ඇයට

[2] https://www.dailymirror.lk/breaking_news/Forced-anal-probe-on-LGBT-people-Justice-Minister-disturbed/108-198954

එරෙහිව නීතිමය නඩුවක් ගොනු කිරීමේ අපේක්ෂාවෙනි. කෙසේ වෙතත්, මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම මත ඇය රැඳවුම් භාරයෙන් නිදහස් කර ඇත.[3]

6.2.3. කෑගල්ල ප්‍රදේශයේ තවත් සමරිසි තරුණයෙක් තම නිවසට තමන් ගැන ප්‍රකාශ කිරීමෙන් පසු ඥාතීන්ගෙන් විවිධ නින්දා අපහාසවලට ලක්විය. මේ නිසා ඔහු තම පවුලෙන් ඈත් වී නිවස හැර ගොස් ඇත. කෑගල්ල ප්‍රදේශයේම තවත් සමරිසි තරුණයෙකුට තවත් පිරිමි පුද්ගලයෙකු සමඟ ඇති සම්බන්ධය ඔහුගේ පවුලේ අය දැනගැනීමෙන් පසු මානසික, චිත්තවේගීය සහ වාචික අපයෝජනයට ලක් වී රට හැර යාමට සිදු විය.

6.2.4. තවත් අවස්ථාවක කෑගල්ලේ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් GRC වෙත අයදුම් කිරීමට පෙර උපදේශන සැසිවලට පැමිණීම වළක්වා ඇත. ඇය LGBTI+ ප්‍රජාවට සම්බන්ධ කිසිදු කාර්යයකට සහභාගී වීමෙන් පවා වළක්වා ඇත..

6.2.5. 2019 ඔක්තෝම්බර් මාසයේදී මඩකලපුවේ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවකගේ පවුලේ සාමාජිකයින් විසින් ඇයව රූපලාවන්‍ය ශිල්පී පුහුණුවකට සහභාගී වීම වළක්වා ඇති අතර, ඇය මාසයක් පමණ පාඨමාලාව කරගෙන ගිය විට, ඇයගේ වේශ නිරූපණ උපකරණ විනාශ කර, වසරක් පමණ මානසික හා චිත්තවේගීය අපයෝජනයන්ට ලක් කරන ලදී.

## 7. සෞඛ්‍යය ක්ෂේත්‍රය තුළ අපකීර්තිය සහ වෙනස්කොට සැළකීම.

7.1. 2021 ජූලි මාසයේ මහනුවරදී පොලිස් නිලධාරීන් සඳහා පුහුණුවක් පැවැත්වූ උපදේශකවරියක වන අමා දිසානායක විසින් සමරිසිභාවය ළමා ලිංගික අපයෝජනයට සමාන කරමින් ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කළාය. පුහුණු සැසියේ වීඩියෝව ඇගේ යූ ටියුබ් නාලිකාවේ ප්‍රකාශයට පත් කර ඇති අතර වෙනත් සමාජ මාධ්‍ය වේදිකාවල ද බෙදා ගන්නා ලදී. ඇය LGBTI+ පුද්ගලයන් සඳහා පරිවර්තන ප්‍රතිකාරය ප්‍රවර්ධනය කර දේශන පවත්වයි. මෙම සිද්ධියට ප්‍රතිචාර වශයෙන්, LGBTI+ ක්‍රියාකාරීන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට (HRCSL) පැමිණිලි කළ අතර අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ද ගොනු කළහ. සැප්තැම්බර් මාසයේදී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දින 14ක් ඇතුළත ප්‍රතිචාර දක්වන ලෙස පොලිස්පති (IGP) වෙත නියෝගයක් නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, මානව හිමිකම් කොමිසමේ විමර්ශනයේ ප්‍රතිඵලය තවමත් ප්‍රසිද්ධ කර නැත. නොවැම්බර් මාසයේදී, LGBTI+ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කළේ, ශ්‍රී ලංකාවේ LGBTI+ පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් කොන් කරන සහ උල්ලංඝණය කරන පුහුණු කිරීම්, දේශන, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම පොලිසියට තහනම් කරන නියෝගයක් ඉල්ලා සිටිමිනි.[4]

7.2. 2016 දී, සෞඛ්‍ය අමාත්‍යාංශය (MoH) විසින් ලිංගික සංක්‍රාන්ති සමාජභාවී ක්‍රියාවලියට භාජනය වන හෝ සම්පූර්ණ කරන ලද සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය (GRC) නිකුත් කිරීම පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලද අතර, උපතින් ලැබුණු ලිංගිකත්වයේ සිට ඔවුන්ගේ ලිංගික අනන්‍යතාවයට නෛතික ලේඛන වෙනස් කිරීමේ ක්‍රියාවලිය ඒ හරහා විධිමත් කරයි. මෙම ක්‍රියාවලිය පුරුෂයාගේ සහ ස්ත්‍රියගේ ද්විමය

[3] https://sinhala.lankanewsweb.net/05/09/16267/

[4] https://www.equal-ground.org/breaking-news-court-of-appeal-grants-leave-to-proceed-with-equal-grounds-writ-petition-against-police-ama-dissanayake-over-homophobia-and-dis/

අනන්‍යතාවයන් පමණක් හඳුනා ගන්නා බැවින් ද්විමය නොවන අනන්‍යතා ඇති පුද්ගලයන් එයින් බැහැර කර ඇත. සංක්‍රාන්ති සමාජභාවී සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව තම ලිංග අනන්‍යතාවයට අනුව තම නීතිමය ලියකියවිලි වෙනස් කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතා රැසක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීමේ සහතිකය මගින් අඩු කර ඇතත්, ඔවුන් තවමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව බොහෝ විට නොදන්නා රාජ්‍ය නිළධාරීන් සහ ආයතන තුළ ඇති නිළධාරීවාදය නිසා වෙනස්කොට සැළකීමට හා අපකීර්තියට මුහුණ දීමට සිදු වේ.

7.3. GRC ක්‍රියාවලිය බොහෝ දුරට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි LGBTI+ පුද්ගලයන් පිළිබඳ අනු කමිටුවේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක් විය[5]. මේ වන විට එම අනුකමිටුව සිය මෙහෙයුම් නවතා දමා තිබීම කනගාටුවට කරුණකි.[6] [7] [8]

7.4. මෙම වාර්තාව සැකසීමේ ප්‍රජා උපදේශන වලදී, LGBTI+ ප්‍රජා සාමාජිකයින්ගේ තොරතුරු වල රහස්‍යභාවය නැති කිරීම, වෛද්‍ය කාර්ය මණ්ඩලය විසින් වාචික සහ මානසික අපයෝජනයන් සිදුකිරීම, වාට්ටුවලට ඇතුළත් කිරීමේදී කෙනෙකුගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනා නොගැනීම සහ වෙනත් ආකාර ඇතුළු ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට මුහුණ දුන් අවස්ථා ගණනාවක් සපයා ඇත. සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වීමේදී වෛද්‍ය පරීක්ෂණ වලදී වෙනස්කම් කිරීම, හිරිහැර කිරීම සහ අපකීර්තිය ට මුහුණ පෑමට සිදු වේ. සෞඛ්‍ය පද්ධතිය තුළ එවැනි වෙනස් කොට සැළකීම් සහ අපයෝජනයන් නිසා ඔවුන් සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වීම සීමා කිරීම, බැහැර කිරීම හෝ වළක්වාලීම හෝ සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වීමට ඔවුන් අධෛර්යමත් කිරීම සිදු කරයි..

7.5. සංක්‍රාන්ති –සමාජභාවීය පුද්ගලයන්ගේ ක්‍රියාවලියට සහය නොදෙන ලෙස වෛද්‍යවරුන් ඔවුන්ගේ දෙමාපියන්ට බලපෑම් කළ අවස්ථා තිබේ. වෛද්‍ය වෘත්තිකයන්ගෙන් ලැබෙන එවැනි උපදෙස් නිසා සංක්‍රාන්ති සමාජභාවී දරුවන්ට සහය දක්වන පවුල් සාමාජිකයන් සහයෝගය ලබා නොදී හිරිහැර කරන තත්ත්වයන් දක්වා වෙනස් කළ හැකිය.

7.5.1. මඩකලපුවේ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් 2021 නොවැම්බර් මාසයේදී මඩකලපුව රජයේ රෝහලට හෝමෝන ප්‍රතිකාරය ලබා ගැනීමට ගිය අවස්ථාවේදී වෛද්‍යවරයා ඇයට දන්වා ඇත්තේ පසුදා ඇයගේ දෙමාපියන් සමඟ පැමිණෙන ලෙසයි. පසුදා ඇය සිය දෙමාපියන් සමඟ රෝහලට ගිය අවස්ථාවේදී වෛද්‍යවරයා ඇයට අවවාද කර ඇත්තේ ඇයට මානසික රෝගයක් ඇති බවත්, ඇයට අවශ්‍ය පරිදි කටයුතු කිරීමට ඉඩ නොදෙන ලෙසත්ය. එහි ප්‍රතිඵලයක් ලෙස මීට පෙර බොහෝ උපකාර කළ පවුලේ සාමාජිකයන් ඇයට උපකාර කිරීම නවතා ඇයට හිරිහැර කිරීමට පටන් ගෙන තිබේ.

7.5.2. මඩකලපුවේ පදිංචි 27 හැවිරිදි සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් යාපනය ශික්ෂණ රෝහලේදී තවත් එවැනිම සිදුවීමකට මුහුණ දී තිබේ. 2020 මාර්තු 20 වන දින, අන්තරාසර්ග විශේෂඥ වෛද්‍යවරිය (consultant endocrinologist), ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංක්‍රාන්ති ලිංගික ක්‍රියාවලිය ආරම්භ කිරීමට අවසර දීම සම්බන්ධයෙන් ඇගේ පියාට බැණ වැදී ඇත.

7.6. වෛද්‍යවරුන් සහ වෛද්‍ය කාර්ය මණ්ඩලය LGBTI+ පුද්ගලයින්ට වාචිකව අපයෝජනය කර වෙනස් කොට සැළකීමේ වෙනත් සිදුවීම් ද වාර්තා වී ඇත.

---

[5] https://www.hrcsl.lk/thematic_sub_com/rights-of-lgbtiq-persons/

[6] https://www.hrcsl.lk/about/members-of-the-commission/

[7] https://www.hrcsl.lk/new-chairperson-and-commissioners-to-the-human-rights-commission-of-sri-lanka/

[8] HTTPS://SRILANKABRIEF.ORG/SRI-LANKA-HUMAN-RIGHTS-COMMISSION-DOWNGRADED-BY-UN-BODY-THE-GLOBAL-ALLIANCE-OF-NATIONAL-HUMAN-RIGHTS-INSTITUTIONS/

7.6.1. 2020 ජනවාරි 27 වන දින රජයේ රෝහලක ලිංගික රෝග සායනයෙහි වෛද්‍යවරියක් (venerologist) "ඔබ සමලිංගිකයෙකු ලෙස දිගටම සිටියහොත් ඔබට HIV වැලදෙනු ඇතැයි" යැයි පවසමින් ඇයට වාචිකව අපහාස කළ බව මඩකලපුවේ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් පැවසුවාය.

7.6.2. කොළඹ රජයේ රෝහලක සිදුවූ තවත් සිදුවීමකදී ප්‍රධාන හෙදියක් ලිංගික අවයව ප්‍රතිස්ථාපනය කිරීමේ සැත්කමකට භාජනය වූ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයෙකු බැලීමට කිසිදු අමුත්තන්ට ඉඩ නොදී ඇත්තේ එම සැත්කම අනවශ්‍ය යැයි සිතූ නිසාය. 'අනවශ්‍ය ශල්‍යකර්මයක්' කිරීම සම්බන්ධයෙන් ඇය වෙනත් වෛද්‍ය කාර්ය මණ්ඩලයක් ඉදිරියේ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයාව හෙලා දැකීම හා අවමානයට ලක් කර ඇත.

7.6.3. තවත් සිදුවීමක දී, උපදේශක මනෝ වෛද්‍යවරයකු විසින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු GRC සම්බන්ධ ලියකියවිලි ලබා ගැනීමට එහි ගිය විට 'මානසික රෝගියෙක්, වංචාකාරයෙක්, අපරාධකාරයෙක්' යැයි චෝදනා කර ඇත. ඇයගේ පරම්පරාව සහ ඇගේ චරිතය වැනි ඇයගේ සංක්‍රාන්ති ක්‍රියාවලියට සම්බන්ධ නැති අනවශ්‍ය පුද්ගලික ප්‍රශ්න ද ඔවුන්ගෙන් අසා ඇත.

7.7. උපදේශනයට සහභාගී වූවන් ඔවුන්ගේ අනන්‍යතාවය සහ වෛද්‍ය තොරතුරු බාහිර පාර්ශ්වයන් සමඟ හෙළි කිරීමෙන් ඔවුන්ගේ රහස්‍යභාවය කඩ කිරීම පිළිබඳ චෝදනා ද ඉදිරිපත් කර ඇත.

7.7.1. එක් අවස්ථාවක, හලාවත ලිංගාශ්‍රිත රෝග (STI) සායනයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වෙනත් පිරිමින් (MSM) සමඟ ලිංගිකව එක්වන පිරිමින්ගේ හඳුනාගැනීමේ තොරතුරු බාහිර පාර්ශව සමඟ බෙදාගෙන තිබුණි.

7.7.2. තවත් සිදුවීමකදී, ලිංගික සෞඛ්‍යය පිළිබඳ ප්‍රජා සත්කාර සේවා සපයන අනුරාධපුර LGBTI+ හිමිකම් සහ ප්‍රජා සේවාවන් සපයන ආයතනයක් වන රජරට ගැමි පහන ආයතනයෙහි කාර්ය මණ්ඩල සාමාජිකයෙකු රහස්‍යභාවය කඩ කිරීමකට මුහුණ දී ඇති අතර, මෙම පුද්ගලයා ලිංගාශ්‍රිත රෝග සායනයට පැමිණි බව වෛද්‍යවරයකු රෝහල් කාර්ය මණ්ඩලයට දන්වා ඇත. පෙර දින 2021 පෙබරවාරි 5 වැනි දින ඔහු සායනයට යාම ඇත්ත වශයෙන්ම කාර්යාල වැඩකටයුතුවලට සම්බන්ධ වුවද, ඔහුට ලිංගාශ්‍රිත රෝග වැළදී තිබිය හැකි බැවින් වෛද්‍ය පූර්වාරක්ෂාවන් ගත යුතු බවට ඉඟි කර ඇත..

7.8. උපතේදී ලැබී ඇති ලිංගිකත්වයට වඩා වෙනස් ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් නිළධාරීන් හඳුනා නොගැනීම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් අත්විඳින ලද තවත් ගැටලුවකි.

7.8.1. ත්‍රිකුණාමලයේ පදිංචි වයස අවුරුදු 26ක සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් 2021 නොවැම්බර් 20 සිට 25 දක්වා ත්‍රිකුණාමලය රජයේ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබද්දී බලහත්කාරයෙන් පිරිමි වාට්ටුවට ඇතුළත් කර ඇත. කාන්තා වාට්ටුවට ඇතුළත් කරන ලෙස කළ ඉල්ලීමක් කළ ද වෛද්‍ය වරයා විසින් නොසලකා හැර තිබේ. රෝහලේ නාන කාමරය තුළදී ද ඇය ලිංගික අතවරයකට මුහුණ දී ඇති අතර එහිදී නාඳුනන පුද්ගලයකු ඇය පිටුපසින් බදාගෙන ලිංගික අතවර කර ඇත. මහ හඬින් කෑ ගසා එළියට දුවද්දී ඇයට උදව් කිරීමට හෝ ඇයට ඇහුම්කන් දීමට කිසිවෙකු සිටියේ නැත. වාට්ටුවේ ජනාකීර්ණ වීම නිසා ඇයට වෙනත් පිරිමියෙකු සමඟ ඇඳ බෙදා ගැනීමට සිදු වූ අතර එය ඇයට අපහසු වූ අතර ඇගේ පෞද්ගලිකත්වය සහ මානව ගරුත්වය උල්ලංඝනය විය.

**8. අධ්‍යාපන ආයතනවල වෙනස්කොට සැළකීම සහ හිරිහැර කිරීම.**

8.1. මෙම වාර්තාව සැකසීමේ -සාකච්ඡා සඳහා සහභාගී වූ තරුණ පුද්ගලයෙකු සඳහන් කළේ, ලිංගික දිශානතිය හා සමාජභාවී අනන්‍යතාවය මත හෝ සමරිසි පුද්ගලයින් සමඟ ප්‍රේම සම්බන්ධතා පැවැත්වීමෙන් පසු පාසල් ගුරුවරුන් හා පරිපාලනය විසින් ඒ බව දැනුවත් වීමෙන් පසුව ශාරීරික, චිත්තවේගීය සහ මානසික හිංසනයන් කිහිපයක් පිළිබඳව වලට මුහුණ දුන් බවයි. පාසල් ගුරුවරුන් හෝ පරිපාලනය විසින් දැනුවත් වන ලදී. පාසල් වයසේ දරුවන්ගේ ලිංගිකත්වය ගැන සාකච්ඡා කිරීම තහනම් විෂයක් වන බැවින්, ඔවුන් මුහුණ දෙන බොහෝ උල්ලංඝනයන් LGBTI+ සංවිධාන වෙත වාර්තා නොකළ හැකිය.

8.1.1. 2020 දී කෑගල්ල ශාන්ත මරියා විද්‍යාලයේ 2022 උසස් පෙළ විභාගය හදාරන පාසල් වයසේ සමරිසි තරුණයෙකුට සමාජ මාධ්‍යවල LGBTI+ ගැටළු පිළිබඳව ලිවීම් කිහිපයක් ප්‍රකාශයට පත් කර ඇතිනිසා විනය පරීක්ෂණයකට, වාචික හිරිහැරවලට, චිත්තවේගීය අපයෝජනයන්ට ලක්ව පාසලෙන් ඉවත් වන ලෙසට තර්ජනය කර ඇත. අධ්‍යාපනය මේ වන විට ඔන්ලයින් අවකාශයට මාරු කර ඇති බැවින්, මෙම ගැටළුව විසඳා ගැනීමකින් තොරව වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ ඇදී යමින් ඇත.

8.1.2. කෑගල්ල ප්‍රදේශයේ දැනට වයස අවුරුදු 23-26 වයස්වල පසුවන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් තිදෙනෙකු කියා සිටියේ පාසල් අධ්‍යාපනය අතරතුර විශේෂයෙන් පෙනුම හේතුවෙන් තමන්ට වාචික හිරිහැරවලට ලක් වූ බවයි. ඔවුන්ගෙන් දෙදෙනකුට ගුරුවරුන් පවසා තිබුණේ “මෙසේ හැසිරීමෙන් ඔබට පහළ තියන එක (ලිංගික ඉන්ද්‍රිය) ලැබෙන්නේ නැත” යනුවෙනි. ඔවුන් නරක සිසුන් ලෙස ලේබල් කර ඇති අතර ගුරුවරුන් ඔවුන්ට වෙනත් කිසිදු සිසුවෙකු සමඟ ඇසුරු කිරීමට ඉඩ දී නැත.

**9. අනෙකුත් රාජ්‍ය නිළධාරීන් විසින් වෙනස් කොට සැළකීම.**

9.1. පොලිසියෙන් සිදුවන වෙනස් කොට සැළකීම සහ ප්‍රචණ්ඩත්වය:

9.1.1. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් විසින් තමන්ට වෙනත් අයගෙන් සිදු වූ උල්ලංඝනයන් සහ අපයෝජනයන් සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි භාර ගැනීම පොලිස් නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කළ අවස්ථා ගණනාවක් තිබේ. එමෙන්ම ඔවුන්ට පොලිස් නිළධාරීන් ද වාචිකව බැන වැදී ඇත.

9.1.1.1. එක් සිදුවීමකදී නැගෙනහිර පළාතට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ කරෙයිතිව් පොලිස් ස්ථානයේ පොලිස් නිළධාරිනියක් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු මුහුණ දුන් ශාරීරික පහරදීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් භාර ගැනීම ප්‍රථමයෙන් ප්‍රතික්ෂේප කර ඇත්තේ ඇය අපරාධකරුවන් යැයි කියනු ලබන අයගේ පදිංචි ලිපිනයන් ලබා දී නොමැති නිසාවෙනි. වින්දිතයා විසින් අපරාධකරුවන් යැයි කියනු ලබන අයගේ පදිංචි ලිපිනයන් සොයා ගැනීමට සමත් වූ විට, පොලිසිය විසින් මෙම පැමිණිල්ල සාමකාමීව සමථයකට පත් කරන ලෙස ඉල්ලා සිටි අතර ඔවුන්ට සමාව දෙන ලෙස ද ඉල්ලා ඇත.

9.1.1.2. 2021 ඔක්තෝම්බර් 4 වෙනිදා, ගාල්ලේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකුට පොලිස් නිළධාරියෙකු විසින් ඇයට “පොන්න නඩු” නොගෙන එන ලෙසට බැණ වැදී එම පුද්ගලයාට උපදෙස් දී ඇත්තේ ඇය අඳින පළඳින ආකාරය වෙනස් කර පිරිමියෙකු ලෙස හැසිරෙන ලෙසයි. පසුගිය මාර්තු 22 වනදා ගම්පහ ප්‍රදේශයේ අසල්වැසියෙකු සහ

සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් අතර ඇති වූ ආරවුලක් සමථයකට පත් කිරීමට පැමිණි පොලිස් නිලධාරියෙකු සංක්‍රාන්ති කාන්තාවගේ ඇඳුම් පැළඳුම් සහ බාහිර පෙනුම කෙරෙහි අවධානය යොමු කරමින් ඇයට පරුෂ වචනයෙන් බැන වැදී ඇයට නින්දා අපහාස කර ඇත.

9.2. අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගෙන් සිදුවන වෙනස්කොට සැළකීම.

9.2.1. GRC හෙවත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය සමග ඇති ක්‍රියාවලිය පිළිබඳව අදාළ නිලධාරීන් නොදන්නා නිසාත්, රාජ්‍ය නිලධාරීන්ගේ වෙනස් කොට සැළකීමේ ආකල්ප සහ නොදැනුවත්කම නිසාත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය (GRC) සඳහා අයදුම් කරන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් විවිධ ප්‍රමාදයන්ට ලක්වන සිදුවීම් ගණනාවක් වාර්තා වී තිබේ.

9.2.1.1. 2021 ජනවාරි මාසයේදී, සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් GRC සඳහා අයදුම් කිරීමට ග්‍රාම නිලධාරී හමුවීමට ගිය විට, උපතින් ලැබී ඇති ලිංගිකත්වයට වඩා වෙනස් වූ ඇගේ වර්තමාන ලිංගික අනන්‍යතාවය නිසා ලිපියක් ලබා දීම නිළධාරියා ප්‍රතික්ෂේප කර ඇත. ඇය වෛද්‍ය වාර්තා සහ අනෙකුත් උපකාරක ලියකියවිලි පෙන්වූ විටත් ඔහු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරයා එවැනි ක්‍රියා පටිපාටියක් සම්බන්ධයෙන් තමාට උපදෙස් ලබා නොදුන් බව පවසමිනි.

## 10. රැකියා සම්මුඛ පරීක්ෂණ සහ සේවා ස්ථානවල වෙනස්කොට සැළකීම.

10.1. රැකියා සම්මුඛ පරීක්ෂණ ස්ථානවල වෙනස්කොට සැළකීම.

10.1.1. රැකියා සම්මුඛ පරීක්ෂණවලදී වෙනස්කම් කිරීම බොහෝ LGBTI+ පුද්ගලයන් මුහුණ දෙන පොදු ගැටලුවකි. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ ඔවුන්ගේ සමාජභාවී ප්‍රකාශනය උපතේදී ලැබුණු ඇති ලිංගිකත්වයට වඩා වෙනස් වූවන් එවැනි අත්දැකීම් වලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇත.

10.1.1.1.1. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රකාශනය ස්ත්‍රීමය ලාලිත්‍යයක් ආකාරයට අති කෑගල්ල ප්‍රදේශයේ සමරිසි තරුණයෙකුට සම්මුඛ පරීක්ෂකවරයා ඔහු එසේ ඇවිදින්නේ සහ කතා කරන්නේ මන්දැයි ප්‍රශ්න කර ඇත. ඔහුගේ සමාජභාවී ප්‍රකාශනය නිසා තමා රැකියා අවස්ථාවට තෝරා නොගත් බව එම තරුණයා විශ්වාස කරයි..

10.1.1.1.2. එවැනිම සිදුවීමක් පුත්තලම දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර, ලාලිත්‍යයෙන් යුතු ප්‍රකාශනයක් සහිත සමරිසි පුරුෂයෙකුගේ කටහඩ, ඔහු ඇවිදින ආකාරය සහ හැසිරෙන ආකාරය ගැන ප්‍රශ්න කරමින් රැකියා සම්මුඛ පරීක්ෂකයින් විසින් ඔහුට හිරිහැර කිරීමේ සිද්ධියක් වාර්තා විය. සමාජභාවී ප්‍රකාශනය හේතුවෙන් තමාට රැකියා අවස්ථාව ප්‍රතික්ෂේප කළ බවද ඔහු ප්‍රකාශ කළේය.

10.1.1.1.3. තවත් අවස්ථාවක, ගම්පහ දිස්ත්‍රික්කයේ තවත් සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් පොල් පොහොර සමාගමක රැකියා සම්මුඛ පරීක්ෂණයට ගිය අවස්ථාවේදී රැකියා සම්මුඛ පරීක්ෂකවරුන් විසින් අවමන් කර ඇත. පිරිමින්ට කළ හැකි දේ ඇයට කළ හැකිදැයි ඇයගෙන් විමසා ඇත.

10.2. වැසිකිළි තෝරා ගැනීමේදී වෙනස්කොට සැළකීම: බොහෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සාමාන්‍යයෙන් පිරිමි හෝ ගැහැණු ලෙස වර්ගීකරණය කර ඇති බැවින් පොදු ස්ථානවල සහ සේවා ස්ථානවල වැසිකිළි භාවිතා කිරීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙයි. බොහෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් තම ලිංග අනන්‍යතාවයට අනුව වැසිකිළි තෝරාගැනීමේදී ගැටලුවලට මුහුණ දී ඇත.

10.3. සේවා ස්ථානවල සිදුවන වෙනත් හිරිහැර: LGBTI+ පුද්ගලයන් වාචික, චිත්තවේගීය සහ වෙනත් ආකාරයේ අපයෝජනයන් සහ වෙනස්කම් කිරීම්, පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම් සහ සේවා ස්ථානවලින් ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් රැකියා අවස්ථා අහිමිවීම්වලට ලක්ව ඇත.

10.3.1. පුත්තලම ප්‍රදේශයේ ස්වර්ණාභරණ අලෙවිසැලක සේවය කරන ලාලිත්‍යයක් සහිතව තම සමාජභාවය ප්‍රකාශ කරන සමරිසි පුරුෂයෙකු නිරන්තරයෙන් නින්දාවට ලක්වන අතර, ඔහුගේ සමාජභාවී ප්‍රකාශනය හේතුවෙන් කායික, වාචික සහ මානසික හිංසනයට ලක් වේ. කෙසේ වෙතත්, රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඔහුට වෙනත් රැකියාවක් සොයා ගැනීමට නොහැකි වූ නිසා ඔහු එම රැකියාව දිගටම කරගෙන යයි.

10.3.2. උතුරු මැද පළාතේ අනුරාධපුර ප්‍රදේශයේ තවත් අවස්ථාවකදී, සමරිසි තරුණයෙකුගේ ජංගම දුරකථනයට ප්‍රවේශ වූ ඔහුගේ ආයතනයේම සගයෙක්, ඔහු තම සහකරු සමඟ කළ වීඩියෝ දුරකථන ඇමතුමක පටිගත කිරීමක් සමාජ මාධ්‍ය වෙත මුදා හැරියේය. මෙම වීඩියෝව ඔහුගේ සේවා ස්ථානයේ සිටින අනෙකුත් සගයන් සහ ඥාතීන් විසින් දැකීමෙන් පසු, ඔහු නින්දාවට, වාචික හිරිහැරවලට සහ චිත්තවේගීය අපයෝජනයන්ට ලක්ව ඇත. ඔවුන් විසින් සේවා ස්ථානයේ කළමනාකාරීත්වයට කරන ලද පැමිණිලි මත ඔහුව රැකියාවෙන් නෙරපා හරිනු ලැබ ඇත්තේ ඔහු ලජ්ජාවට පත් වීම නිසාවෙන් හා රැකියා ස්ථානයේ නමට අපහාසයක් ලෙස සලකමිනි.

10.3.3. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලයේදී, LGBTI+ සාමාජිකයින්ට උදව් කිරීමට කැමති බව පවසමින් facebook සටහන් පළ කළ 24 හැවිරිදි (F To M) සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකුට සේවා ස්ථානයේ සගයන් විසින් වාචික සහ චිත්තවේගීය අපයෝජනයන්ට ලක් කර ඇත.

## 11. දේශපාලන සමරිසි භීතිකාව

11.1. 2022 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයේ සන්දර්භය තුළ දේශපාලකයින් විසින් සිදු කළ පසුගිය කාලය තුළ බෙහෙවින් පැතිර ගිය සමරිසි භීතිකාව හා සංක්‍රාන්ති භීතිකාව නිසා සිදු කළ ප්‍රකාශයන් දැන් අඩු වී ඇති බව පෙනේ. හිටපු ජනාධිපති සිරිසේන විසින් අගමැති වික්‍රමසිංහට එරෙහිව කරන ලද අපහාසාත්මක ප්‍රකාශ සහ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මෙන් LGBTI+ ඉල්ලීම් ඉවත් කිරීම ගැන පුරසාරම් කියවීම තරමක් ප්‍රසිද්ධියට පත් විය. 2020 වසරේ පැවති ශ්‍රී ලංකාවේ මහ මැතිවරණයේ සන්දර්භය තුළ, එවකට මැතිවරණ අපේක්ෂක විජේදාස රාජපක්ෂ (වත්මන් ඇමති) මැතිවරණ පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරමින් කියා සිටියේ "සමලිංගික පනත" නමින් පනතක් රටේ සංස්කෘතියට පටහැනි බැවින් එය සම්මත කිරීමට ඉඩ නොදුන් බවයි. එමෙන්ම තවත් මැතිවරණ අපේක්ෂකයෙකු වන වෛද්‍ය කාවින්ද ජයවර්ධන ද රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකදී සමරිසිභාවය මානසික රෝගයක් බවට සමරිසි විරෝධී

ප්‍රකාශයක් කළේය. ජනාධිපති රාජපක්ෂගේ සොහොයුරු මහින්ද රාජපක්ෂ සහ අනෙකුත් දේශපාලකයෝ ද විපක්ෂයේ ප්‍රධාන අපේක්ෂකයාට දරුවන් නොමැතිවීම ගැන විහිළු කළහ.[9].

12. **LGBTI+ ගැටළු වාර්තා කිරීමේදී මාධ්‍ය ආචාර ධර්ම සම්බන්ධ ගැටළු**

12.1. LGBTI+ ගැටළු වැරදි ලෙස භාවිතා වන සදාචාරාත්මක භාෂාවෙන් වාර්තා වී ඇති අවස්ථා රාශියක් ඇත. එවැනි මාධ්‍ය වාර්තාකරණය බොහෝ විට LGBTI+ පුද්ගලයන් කෙරෙහි ඒකාකෘති ආකල්ප නිර්මාණය කර ඇති අතර ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයට ඒ මගින් විවිධ ගැටලු ද ඇති වී ඇත. ශ්‍රී ලංකාවේ මාධ්‍ය හිමිකාරීත්ව නිරීක්ෂණයට අනුව, රූපවාහිනී ප්‍රේක්ෂකයින්ගෙන් 54.8% ක්, ගුවන්විදුලි ප්‍රේක්ෂකයින්ගෙන් 45.59% ක් සහ පුවත්පත් ප්‍රේක්ෂකයින්ගෙන් 79.4% නිශ්චිත දේශපාලන පක්ෂයක්, දේශපාලනඥයෙක් හෝ දේශපාලන කණ්ඩායමක් විසින් හෝ නිශ්චිත දේශපාලන අනුබද්ධිත හිමිකරුවෙකු විසින් පාලනය කරනු ලැබේ. කිසියම් නියාමන රාමුවක් ගෙන ඒමට සහ ස්වයං නියාමන යාන්ත්‍රණයක් වෙනුවෙන් පෙනී සිටීමට රජය දරන උත්සාහයට මාධ්‍ය ප්‍රජාවන් ප්‍රතිරෝධය දක්වන සන්දර්භයක් තුළ, සමාජභාවය සහ ලිංගිකත්වය සම්බන්ධ ගැටළු වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ප්‍රජාවන් අතර වර්ධනය වී නොමැත. LGBTI+ ප්‍රජාව පරිවර්තන චිකිත්සාව පිළිබඳ වෙළඳ දැන්වීම් වලට එරෙහිව දිගු කලක් තිස්සේ පෙනී සිටියද, සමහර පුවත්පත් තවමත් "සමලිංගික ලිංගික ආකර්ෂණය හෝ හැසිරීම නිවැරදි කිරීමට" පොරොන්දු වන එවැනි දැන්වීම් තවමත් පළ කරයි.

**13.** **මානව හිමිකම් ක්‍රියාකාරීන් මුහුණ දෙන පලිගැනීම් සහ හිරිහැර**

13.1. LGBTI+ අයිතිවාසිකම් ක්‍රියාකාරීන් තර්ජන, බිය ගැන්වීම්, නිතර නිතර ඔවුන්ගේ කාර්යාලයට පොලිසියෙන් සහ වෙනත් නිලධාරීන් පැමිණීම, ඔත්තු බැලීම් සහ පොලිසියේ විමසීම්, ආගමික කණ්ඩායම්වල තර්ජන, කාර්යාල අවකාශයන් කුලියට ගැනීමේ දුෂ්කරතා සහ වෙනත් අභියෝගවලට මුහුණ දී ඇත.

13.1.1. 2018 මාර්තු 18 වන දින, HIV/AIDS නිවාරණය සහ LGBTI+ අයිතීන් පිළිබඳව කටයුතු කරන ප්‍රජාවට සේවාවන් සපයන ආයතනයකට අයත් ගාල්ල දිස්ත්‍රික්කයේ කාර්යාල පරිශ්‍රයට එහි කාර්ය මණ්ඩලය නොමැති විට පොලිසිය සහ මාධ්‍ය ගෙන්වා ගම්වාසීන් විසින් බලහත්කාරයෙන් විවෘත කර ඇතුළු වන ලදී. සිදුවන්නේ කුමක්දැයි විමසූ රාජ්‍ය නොවන සංවිධාන ජාලයේ පුද්ගලයන් දෙදෙනකුට පොලිසිය සහ මාධ්‍ය ඉදිරිපිටදී ගම්වාසීන් විසින් පොලිස් නිළධාරීන් ඉදිරිපිටදීම පහර දෙන ලදී.. [10] [11]

13.1.2. උතුරු මැද පළාතේ ලිංගික වෘත්තියේ යෙදෙන පුද්ගලයන් සහ LGBTI+ ප්‍රජාව සමඟ කටයුතු කරන තවත් ප්‍රාදේශීය ප්‍රජා සේවාවන් සපයන සංවිධානයක් වන රජ රට ගැමි පහන ආයතනය ඔවුන්ගේ වැඩ කටයුතු හේතුවෙන් විවිධ පලිගැනීම් සහ අභියෝගවලට මුහුණ දී ඇත.

[9] https://economynext.com/womens-activists-demand-mahinda-apologise-to-jalani-over-remark-over-childless-women-72334/
[10] https://youtu.be/rPgX1ZWQ3LQ?t=761
[11] https://www.inform.lk/wp-content/uploads/2019/03/2018-march-english-repression-of-dissent-in-sl-in-jan-march2018.pdf

13.1.2.1. LGBTI+ ප්‍රජාව සහ ලිංගික වෘත්තියේ යෙදෙන පුද්ගලයන් සමඟ වැඩ කරන සංවිධානයක් සඳහා ඉඩකඩ කුලියට දීමට ඉඩම් සහ ගොඩනැගිලි හිමියන් කැමති නොවන බැවින් කාර්යාල අවකාශයක් කුලියට ගැනීම ඔවුන්ට අතිශයින් දුෂ්කර වී ඇත.

13.1.2.2. ඔවුන්ගේ ආයතනයේ සේවය කිරීම නිසා ඔවුන්ගේ කාර්ය මණ්ඩලයට ප්‍රදේශවාසීන් විසින් වාචිකව හිරිහැර කර ඇත.

13.1.2.3. "ගණිකා වෘත්තියට පහසුකම් සැලසීම සහ සමලිංගිකත්වය ව්‍යාප්ත කිරීම" සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් විසින් සංවිධානයට එරෙහිව විවිධ පැමිණිලි ඉදිරිපත් කිරීමෙන් පසු පොලිසිය නිතර එහි ගොස් කාර්ය මණ්ඩලයෙන් ප්‍රශ්න කර සංවිධානය සම්බන්ධයෙන් විවිධ පරීක්ෂණ පවත්වා ඇත.

13.1.2.4. 2022 අප්‍රේල් මාසයේදී යුධ හමුදාවට අනුයුක්තව සේවය කරන බුද්ධි අංශ නිලධාරියෙකු විසින් අනුරාධපුර නගරයේ ලිංගික ක්‍රියාකාරකම් සිදු කළ හැකි ස්ථාන වල දී ලිංගික වෘත්තියේ යෙදෙන පුද්ගලයන්ට කොන්ඩම් සපයන ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු රඳවාගෙන ඇත. එම නිළධාරියා කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වාචිකව බැන වදිමින්, සංවිධාන අධ්‍යක්ෂවරයාට ලබාදුන් දුරකථන ඇමතුම්වලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කර ඇති අතර, ඔවුන් බලහත්කාරයෙන් පොලිස් ස්ථානයට රැගෙන යාමට උත්සාහ කිරීමේදී, මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම ලබා ගැනීමෙන් ඔවුන් නිදහස් කරගැනීමට එම සංවිධානයට හැකිවී තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ සිද්ධිය ලේඛනගත කර ඇත.

13.2. සමහර අවස්ථාවලදී, අයිතිවාසිකම් ක්‍රියාකාරීන් අන්තර්ජාලය හරහා වෛරී ප්‍රකාශ සහ අපහාසාත්මක අදහස් දැක්වීම්වලට ලක් වී ඇත..

13.2.1. රජරට ගැමි පහන වෙබ් අඩවිය අන්තර්ජාලය හරහා අපවාදවලට ලක් වූ අතර ආගමික කණ්ඩායමක් විසින් අසත්‍ය ප්‍රචාර එල්ල කරන ලදී.

13.2.2. යාපනයේ ගුරුනගර් ප්‍රදේශයේ 61 හැවිරිදි සංක්‍රාන්ති ලිංගික ක්‍රියාකාරිනියක වන අනීතා 2021 වසරේ යාපනය LGBTIQ + අතික්‍රාන්ත උත්සවය (Jaffna Queer Festival) සංවිධානය කරන බවට වෙබ් අඩවියක ලිපියක් පළ කිරීමත් සමඟ විවිධ සමාජ මාධ්‍ය කණ්ඩායම්වල අපවාදාත්මක අදහස් රැසකට ලක්විය. මාවීරර් නාල් ( මියගිය දෙමළ ක්‍රියාකාරීන් සැමරීමේ උත්සවය) ට සමගාමීව මෙය සංස්කෘතික වශයෙන් නුසුදුසු විය. මෙම පුවත ප්‍රසිද්ධියට පත් වීමත් සමඟම ඇය මිතුරන්ගෙන් සහ පවුලේ සාමාජිකයන්ගෙන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත.[12]

13.2.3. 2022 ජූනි මාසයේදී, කොළඹ අභිමානයේ පාගමන (Colombo Pride March) සංවිධානය කිරීමට සම්බන්ධ වූ තරුණ ක්‍රියාකාරිකයෙකු අන්තර්ජාලය හරහා වෛරී ප්‍රකාශ සහ අපවාදවලට ලක් විය.

[12] Jaffna District consultation meeting

## 14. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

14.1. 2019 අප්‍රේල් මාසයේදී අත්අඩංගුවට ගත් ලේඛක ශක්තික සත්කුමාර 2019 අගෝස්තු මාසයේදී ඇප මත නිදහස් වන තෙක් මාස 4කට වැඩි කාලයක් රඳවාගෙන සිටියේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා දෙනමක් අතර සමරිසි සබඳතාවක් ඇති බවට ඉඟි කරන කතාවක් ලිවීම නිසාය. සත්කුමාරට ICCPR පනත 2007 යටතේ ආගමික වෛරය ඇවිස්සීම සම්බන්ධයෙන් චෝදනා එල්ල විය. ඔහු අත්අඩංගුවට ගැනීමෙන් පෙනී යන්නේ කලාකරුවන්, සාහිත්‍ය රචකයන් සහ ක්‍රියාකාරීන්ට විශේෂයෙන්ම ආගමික සන්දර්භය තුළ සමරිසි සබඳතා පිළිබඳ කතා කිරීමට හෝ ලිවීමේදී අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා වී ඇති බවයි.

14.2. අවස්ථා කිහිපයකදී, අර්ධ නිරුවත් ඡායාරූපයක් ප්‍රසිද්ධ කිරීම, අසභ්‍ය සමාජ මාධ්‍ය පිටුවක් පවත්වාගෙන යාම සහ අසභ්‍ය වීඩියෝ පටයක් නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රසිද්ධියේ අශෝභන ක්‍රියා සම්බන්ධයෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගන්නා ලදී. 2018 වසරේ භික්ෂූන් වහන්සේ නමක් විසින් කරන ලද පැමිණිල්ලකට අනුව බෞද්ධ විහාරස්ථානයක් ද පිහිටි පිදුරංගල පර්වතයේ දී ගත් අඩ නිරුවත් ඡායාරූපයකට තම නිරුවත හෙළි කළ පාසල් වයසේ තරුණයන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන ඇත. 2020 සැප්තැම්බර් මාසයේදී, MILF අසභ්‍ය රසිකයින් සඳහා 'අසභ්‍ය' ෆේස්බුක් පිටුවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පොලිස් කොස්තාපල්වරයෙකු අත්අඩංගුවට ගන්නා ලදී. 2021 ඔක්තෝම්බර් මාසයේදී දිය ඇල්ලක් අසල එළිමහන් අසභ්‍ය දර්ශන වීඩියෝ කිරීම සම්බන්ධයෙන් යුවළක් අත්අඩංගුවට ගන්නා ලදී. මෙම අසභ්‍ය වීඩියෝව ප්‍රසිද්ධියට පත්වීමත් සමඟ එම වීඩියෝ පටය කළ විෂම ලිංගික යුවළක් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. අඹුසැමි යුවළට එරෙහිව දඩයක් සහ අත්හිටවූ සිර දඬුවමක් නියම කළේය. මෙම සිද්ධියට සමරිසි හැසිරීම් සම්බන්ධ නොවූවත්, LGBTI+ පුද්ගලයන්ට එරෙහිව ඒ හා සමාන චෝදනා එල්ල විය හැකි සම්භාවිතාවක් ඇත. පවතින නීතිමය රාමුව සම්මුතිවාදී සහ එකඟ නොවන අසභ්‍ය දර්ශන අතර වෙනසක් නොපවතින අතර, සමීප සහකරුවන් අතර පුද්ගලික භාවිතය සඳහා සාදන ලද වීඩියෝ බොහෝ අවස්ථා වල අසභ්‍ය වෙබ් අඩවිවල එකඟතාවයකින් තොරව ප්‍රකාශයට පත් කර ඇති බව අපි සටහන් කරමු.

## 15. නිර්දේශ

15.1. පවතින නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට පටහැනි වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තිය අවලංගු කර මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීමට රජය ඉඩ දිය යුතුය.

15.2. පොදු සේවාවන් (හෝටල්, පොදු ප්‍රවාහනය, අධ්‍යාපන ආයතන, ආගමික ආයතන, සේවා ස්ථාන ආදිය) සපයන පෞද්ගලික පාර්ශ්ව විසින් සිදුකරන මානව හිමිකම් කඩවීම්වලට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීමට රජය අවසර දිය යුතුය.

15.3. රජය විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්තිය සහ අයාලේ යන ආඥාපනත, ගුවන් හමුදා පනත සහ හමුදා පනත ඇතුළු සමරිසිභාවය සාපරාධී ලෙස සලකන වෙනත් නීතිවල නිශ්චිත වගන්ති අවලංගු කළ යුතුය.

15.4. ස්ත්‍රී දූෂණ සහ ලිංගික අපරාධ සම්බන්ධ පොදු නීතිමය වගන්ති යටතේ ස්ත්‍රී දූෂණ සහ පිරිමින්ගේ කැමැත්තෙන් තොර ලිංගික සංසර්ගය පිළිගත යුතු බව රජය බලාත්මක කළ යුතුය.

15.5. ස්ත්‍රී පුරුෂ භාවය හඳුනාගැනීමේ සහතික නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටියේ ඒකාකාරී බව නියාමනය කිරීමට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව පියවර ගත යුතුය.

15.6. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් උපදේශන සේවාවන්හි ඒකාකාරිත්වය යෙදවීමට සහ දළ විශ්ලේෂණය සඳහා ජාතික නියාමන ආයතනයක් හඳුන්වා දිය යුතුය. මෙම සේවාවන්/සේවා සපයන්නන්ගේ කොන්දේසි දිශානතීන්, විවිධ ලිංගික අනන්‍යතා අයිතිවාසිකම් සහතික කළ යුතුය.

15.7. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට විශේෂයෙන් සංක්‍රාන්ති ක්‍රියාවලියට (හෝමෝන) සහ සමාජභාවී අනන්‍යතාවය වෙනස් කිරීමේ සැත්කම් සඳහා අවශ්‍ය ඖෂධ නිකුත් කිරීමේදී ඔවුන්ට ඒ සඳහා ප්‍රවේශ වීමට සහ දැරිය හැකි මිල ගණන් සහතික කිරීම සඳහා සේවා සැපයීමේ ඒකාකාරී බව නොසලකා හැරීම වැළැක්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියාමන ආයතනයක් හඳුන්වා දිය යුතුය.

15.8. අධිකරණ අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති සංක්‍රාන්ති සමාජභාවී ආරක්ෂණ පනත රජය විසින් බලාත්මක කළ යුතුය.

15.9. LGBTI+ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නිසි යටිතල පහසුකම් ස්ථාපිත කිරීමට සහ ඒකාකාරී බවින් සහ ඔවුන්ව ඇතුළත් කිරීම් සහිත සේවාවන් නියාමනය කිරීමට රජය සිවිල් බලධාරීන් බලාත්මක කළ යුතුය.

15.10. LGBTI+ පුද්ගලයන් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය “නිවැරදි” කිරීමට උත්සාහ කරන පරිවර්තන ප්‍රතිකාර, වෙනත් ප්‍රතිකාර හෝ එම වැරදි භාවිතයන් තහනම් කිරීමට රජය නීති හඳුන්වා දිය යුතුය.

15.11. ඕනෑම ආකාරයක කන්‍යාභාවය පිළිබඳ පරීක්ෂණ සහ බලහත්කාර ගුද හෝ යෝනි පරීක්ෂණ, බලහත්කාර HIV පරීක්ෂණ තහනම් කිරීමට රජය විසින් නීති හඳුන්වා දිය යුතුය..

15.12. රජය විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත බලාත්මක කළ යුතු අතර, LGBTI+ පුද්ගලයන් ඔවුන්ගේ නිවෙස්වලදී මුහුණ දෙන ගෘහස්ථ හිංසනයන් පිළිබඳ සිදුවීම් විසඳීමට ක්‍රියාශීලී ක්‍රියාමාර්ග ගත යුතුය.

15.13. LGBTI+ පුද්ගලයන් සඳහා සේවා ස්ථානයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා රජය C190 අනුමත කළ යුතුය.

15.14. පුළුල් ලිංගික අධ්‍යාපනය සහතික කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය ගුරු පුහුණුව සහ පාසල් විෂයමාලා යන දෙකටම SOGIESC හඳුන්වා දිය යුතුය.

15.15. සදාචාරාත්මක නොවන වාර්තාකරණය නියාමනය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා ඩිජිටල් මාධ්‍ය සහ පුවත්පත් සඳහා ජාතික මට්ටමේ නියාමන ආයතනයක් රජය විසින් ස්ථාපිත කළ යුතුය.

15.16. උසාවිය මගින් LGBTI+ පුද්ගලයන්ට එරෙහිව ඔවුන්ගේ SOGIE මත පදනම්ව මනෝචිකිත්සක ඇගයීමක් සඳහා නියෝග නිකුත් කිරීම වැළක්වීම සඳහා විනිශ්චය කිරීමේ ආයතනය සහ අනෙකුත් අදාළ කණ්ඩායම් මැදිහත් විය යුතුය.

15.17. LGBTI+ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා බන්ධනාගාර, රැඳවුම් මධ්‍යස්ථාන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ ඇතුළත් කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා රජය නිසි යටිතල පහසුකම් සහ සේවා යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

16. **සිදුවීම් සම්බන්දව ඇමිණුම**

## **01 යොමුව: එප්පාවල සිදුවීම**

වසර 35කට ආසන්න කාලයක් එප්පාවල ප්‍රදේශයේ එකට ජීවත් වූ සමරිසි ස්ත්‍රී යුවළක් පාදක කරගෙන මෙම සිදුවීම යොමු විය. මෙම කාලය තුළ ඔවුන් කලාපය තුළ ප්‍රජාව සමඟ සම්බන්ධ වීම හේතුවෙන් විශාල ප්‍රජා සහයෝගයක් ලබා ගැනීමට හැකි වී තිබිණි. මෙම යුවළගේ ඉපයුම් මාර්ගයක නියැලී සිටි තැනැත්තිය (සාකච්චාවට සහභාගී වූ තැනැත්තා පැවසූ පරිදි වඩාත් පුරුෂයෙකු ලෙස පෙනී සිටි සහකාරිය) විශේෂයෙන් කලාපයේ කෘෂිකාර්මික ප්‍රජාව සමඟ සම්බන්ධ වූ බවත් ඇයගේ මැදිහත්වීම හේතුවෙන් ඔවුන්ගේ ගෞරවයට පාත්‍ර වූ බවත් ප්‍රකාශ විය. සාකච්චාවට සහභාගී වූ තැනැත්තා පවසූ පරිදි, ඉහත සඳහන් කල සහකාරිය සුළු කාලයකට ඉහතදී මිය ගොස් ඇති බවත්, ඇයගේ මියයාමෙන් අනෙත් සහකාරිය සමග එම ස්ත්‍රියගේ පවුල දේපළ සම්බන්ධව ගැටළුකාරී තත්වයක් ඇති කර ගෙන තිබේ. මෙහිදී බොහෝ දේපළ ලියාපදිංචි කර ඇත්තේ මියගිය සහකාරියගේ නමටය. ඇය ආදායමක් ඇති තැනැත්තිය වන අතර ඇය පරිභෝජනය කළ දේපළ සම්බන්ධයෙන් අනෙක් පුද්ගලයාට නීත්‍යානුකූල ප්‍රකාශයක් නොමැති බැවින් ඥාතීන් එම දේපළ ආපසු ලබා ගැනීමට උත්සාහ කර ඇත. කෙසේ වෙතත්, කලාපය තුළ ඔවුන්ට ලැබී ඇති ගෞරවය සහ ස්ථානය හේතුවෙන්, ප්‍රදේශවාසීන් අනිත් ස්ත්‍රියට සහය දක්වමින් තම මතය ප්‍රකාශ කළ බවත්, එම නිසා මියගිය පුද්ගලයා සතු දේපළවලින් කොටසක් අනෙකාට තබා ගැනීමට හැකි වූ බවත් ප්‍රකාශ විය. කෙසේ වෙතත්, ඔවුන්ගේ සබඳතාවය රට තුළ නීත්‍යානුකූලව පිළිගෙන නොතිබූ බැවින් කිසිදු නීතිමය සහායක් ලබා ගත නොහැකි විය.

## **02 යොමුව: එප්පාවල ලිංගික හිංසනයන්ට භාජනය වීමේ සිදුවීම**

සමරිසි තරුණයෙකු හා ඔහුගේ මව ඔවුන් ජීවත්ව සිටි ප්‍රදේශයේ පුද්ගලයින් 10 දෙනෙකු විසින් ලිංගික හිරිහැරවලට භාජනය කර ඇත. එම පුරුෂයා තම ලිංගික දිශානතිය සම්බන්ධව විවෘතව සමාජයේ පෙනී සිටින හෙයින් , පළමුව ඔහුව මෙම පිරිස විසින් ඉතා තදබල ලිංගික හිංසනයන්ට භාජනය වී ඇති අතර ඉන් අනතුරුව ඔහුගේ මවටද ලිංගික හිංසනයන් පමුණුවා ඇති බව සඳහන් විය. මෙම සිදුවීමට මූලික වූ හේතුව ලෙස ප්‍රකාශ වුවේ සිදුවීමට මුහුණ දුන් පුරුෂයාගේ ලිංගික දිශානතියයි. සිදුවීම සම්බන්ධව මෙම පුද්ගලයන් විසින් එප්පාවල පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කිරීමට උත්සාහ කර ඇතත් එම පුද්ගලයාගේ ලිංගික දිශානතිය හේතුවෙන් පොලිසිය එම පැමිණිල්ල භාරගෙන නොමැත.

## **03 යොමුව: රජරට ගැමි පහන සම්බන්ධව හටගත් ආයතනික ගැටලුව**

රජ රට ගැමි පහන යනු උතුරු මැද පළාත තුළ ලිංගික ශ්‍රමිකයන් සහ LGBTIQ ප්‍රජාව සමඟ ක්‍රියා කරන කලාපීය සිවිල් සමාජ ආයතනයකි. රජ රට ගැමි පහන ආයතනයේ අධ්‍යක්ෂ පාලිත මහතා සඳහන් කළේ, ඔවුන් ආවරණය කරන විෂය පථය හේතු කොට ගනිමින් නිවාස හිමියන් ආයතනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ස්ථානයක් කුලියට දීමට අකමැත්තක් දැක්වූ බවයි. මෙම නිසා ආයතනය ස්ථාපනය කිරීමට අවශ්‍ය සුදුසු පරිශ්‍රයක් සොයා ගැනීමට අතිශය දුෂ්කර වූ බවත් ප්‍රදේශය තුල තම ආයතනය දෙස යොමුවන සමාජීය ආකල්පය ඉතා ඍණාත්මක බවත් පාලිත මහතා තව දුරටත් ප්‍රකාශ කර සිටියේය. ආයතනයෙහි කාර්ය මණ්ඩල බොහෝ විට ප්‍රදේශ වාසීන්ගේ වාචික හිංසනයන්ට ලක් වන බවත් ආයතනය විසින් ගණිකා වෘත්තිය හා සමරිසි ප්‍රජාව ප්‍රවර්ධනය කරන බව පවසමින් පොලිසියට විශාල වශයෙන් පැමිණිලි සහ පෙත්සම් (අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කළ පරිදි සෑම සතියකම ) යොමු වන බවත් ඔහු ප්‍රකාශ කළේය. මේ හේතුවෙන් රජරට ගැමි පහන නමින් ආයතනයනමින් වෙනම ගොනුවක් අනුරාධපුර පොලිසිය සමග පවත්වාගෙන යන බවත් තව දුරටත් ආයතනය විසින් සිදුකරනු

ලබන වැඩකටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා පොලිසිය නිරන්තරයෙන් ආයතනයට පැමිණෙන බවත් පාලිත මහතා ප්‍රකාශ කළේය.

**04 යොමුව: රජ රට ගැමි පහන කාර්ය මණ්ඩල සහ යුධ හමුදා බුද්ධි අංශ සමග ඇතිවූ සිදුවීම**

2022 අප්‍රේල් මාසයේදී ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකු ලිංගික ශ්‍රමිකයින්ට උපත් පාලන කොපු ලබා දෙමින් සිටියදී යුධ හමුදා බුද්ධි අංශට අනුයුක්තව සිටින CID නිලධාරියෙකු ඔවුන් රඳවාගෙන ප්‍රශ්න කළ බව රජ රට ගැමි පහන අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කළේය. ඔවුන් එම හමුදා නිලධාරීන්ට කරුණු පැහැදිලි කිරීමට උත්සාහ කර ඇති මුත් ඒ කිසිවක් හෝ ආයතන ප්‍රධානියා ලෙස තමන් හට එම නිලධාරීන්ට දුරකථන ඇමතුමක් හෝ ලබා ගැනීමට එම හමුදා නිලධාරීන් ඉඩ ලබා දී නොමැති බව පැවසූ පාලිත මහතා තව දුරටත් ප්‍රකාශ කර සිටියේ කර සිටියේ තම කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධ කරගැනීම සඳහා කිසිම ආකාරයකින් එම නිලධාරීන් ඉඩ ලබා නොදී ඇති බවයි. අවසානයේ දී පාලිත මහතා ප්‍රාදේශීය මානව හිමිකම් කොමිසමට ඇමතුමක් ලබාදී කාර්ය මණ්ඩලය නිදහස් කර ගැනීමට සමත් වී ඇත. මෙම සිදුවීම සම්බන්ධව ප්‍රාදේශීය මානව හිමිකම් කොමිසමේ ලේඛනගත කර ඇති අතර පාලිත මහතා ප්‍රකාශ කළේ එම හමුදා නිලධාරියාට එරෙහිව තම ආයතනය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ය.

**05 යොමුව: අනුරාධපුර මහ රෝහලේ ලිංගාශ්‍රිත රෝග සායන වෛද්‍යවරයා සම්බන්ධ සිද්ධිය**

අනුරාධපුර මහා රෝහලේ ලිංගාශ්‍රිත රෝග සායනයේ ප්‍රධාන වෛද්‍යවරයාට LGBTIQ ප්‍රජා සාමාජිකයින් සම්බන්ධයෙන් අවබෝධාත්මක ගැටලුවක් පවතින බව රජරට ගැමි පහන අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කළේය. 2021.02.06 මෙම සිදුවීමට මුහුණ දී ඇත්තේ රජ රට ගැමි පහන ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකි. කාර්ය මණ්ඩල සාමාජිකයා හදිසි අනතුරක් හේතුවෙන් ඉහත සඳහන් කල දිනයේදී රෝහල්ගත කර ඇති අතර ඔහු 2021.02.05 දින කාර්යාලීය කටයුතු කිහිපයක් සඳහා ලිංගාශ්‍රිත රෝග සායනයට වෙත ගිය බව පැවසීය. කාර්ය මණ්ඩල සමාජිකයා පැවසූ පරිදි, හදිසි අනතුර හේතුවෙන් ඔහු රෝහල් ගත කර ඇති බව ලිංගාශ්‍රිත සායනයේ වෛද්‍යවරයාට දැනගැනීමට ලැබී ඇති අතර මෙහිදී ඔහු ඊට පෙර දින තම සායනයට පැමිණි බවත් එම නිසා ඔහුගේ අනතුරට ප්‍රතිකාර කිරීමට පමණක් නොව, ඔහු ලිංගාශ්‍රිත රෝගයන් බෝ වීමේ ඉඩකඩ ඇති බව ඉඟි කරමින්, ඔහුගෙන් රෝහල් කාර්ය මණ්ඩලය ආරක්ෂාවීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතු බව එම වෛද්‍යවරයා තම කාර්ය මණ්ඩලයට ප්‍රකාශ කර ඇත. රහස්‍යභාවය උල්ලංඝණය කරන ඔහුගේ ලිංගික දිශානතිය මත පදනම්ව වෙනත් කිසිවකින් ආසාදනය නොවිය යුතුය. එය සෘජුවම වෘත්තියේ ආචාරධර්ම උල්ලංඝනය කිරීමක් මෙන්ම එය ඉතා සමලිංගික බව ද අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කළේය.

**06 යොමුව: පාසිකුඩා සිදුවීම**

2021 අප්‍රේල් 20 වෙනිදා එක් රාජ්‍ය නොවන සංවිධානයක් විසින් සංවිධානය කල නායකත්ව පුහුණුවක් සඳහා අප කණ්ඩායම සහභාගී විය. අපි එහි එක් රැයක් නවාතැන් ගත් අතර එදින රාත්‍රියේදී පාසිකුඩා පොලිසිය අප සිටි ස්ථානයට පැමිණියා. ඔවුන් අපේ හැඳුනුම්පත්, දුරකථනය, බෑගය ඇතුළු සියල්ල පරීක්ෂා කළා. අප සමග සිටි සමහර සංක්‍රාන්ති සමාජභාවිය පුද්ගලයන් තම හැඳුනුම්පත් වෙනස් කර නොමැති නිසා වෙනත් කෙනෙකු ලෙස පෙනී සිටින්නේ බව පවසමින් පොලිසිය එම පුද්ගලයන්ට කායික හිංසනයන් කළ අතර අප සමාජ විරෝධීන් බව පවසමින් අප කණ්ඩායමට වද හිංසා පැමිණුවා. එමෙන්ම අපගේ සමහර අයගේ දුරකථන වල අසභ්‍ය වීඩියෝ පට තිබෙන බව පවසමින් ඔවුන්ට පහර දුන්නා. රාත්‍රී කාලය නිසා අප හා සිටි සමහර පුද්ගලයින් ඇඳුම් ඇඳ නොසිටි අතර ඔවුන්ගේ සමූහ ඡායාප ලබා ගත්තා.

එමෙන්ම අපි හැමෝගෙම ඡායාරූප එකින් එක ගත්තා. මෙම සිදුවීම ඉතා නරක ලෙසින් අපට බලපෑ අතර අදටත් අප මේ නිසා බියට පත් වෙනවා.

**යොමුව 07: මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයාගේ ගැටලුවක්**

මගේ අනන්‍යතා සහතිකය ලබා ගැනීම සඳහා, මම 2021 ජනවාරි මස මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීගෙන් ලිපියක් ලබා ගැනීමට ගියෙමි. තමාට ලිපිය ලබා දිය හැක්කේ පිරිමියෙකු යැයි සඳහන් කරමින් පමණක් බවත් එය වෙනස් කිරීමට නොහැකි බවත් ඔහු ප්‍රකාශ කර සිටියා. මා මේ සම්බන්ධයෙන් වෛද්‍ය වාර්තා පෙන්වා දුන් නමුත් එසේ ලිපියක් ඉදිරිපත් කර නොහැකි බවත් එය වෙනස් කළ නොහැකි බවත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් මේ පිළිබඳව කිසිදු තොරතුරක් ලබා - දී නොමැති බවත් ඔහු කියා සිටියා. මේ නිසා මට තවදුරටත් එම සහතිකය ලබා ගැනීමට නොහැකි වුනා.

**යොමුව 08: මඩකලපුව මහා රෝහලේ සිද්ධිය**

මම සංක්‍රාන්ති – සමාජභාවීය පුද්ගලයෙක්. වයස අවුරුදු 23 දී මම සංක්‍රාන්ති කෙනෙකු බව මගේ දෙමාපියන් දැනගත් විට මට මගේ දෙමාපියන්ගෙන් විවිධ විරෝධතා මතු වුනා. නමුත් පසුව මගේ දෙමව්පියන් තත්වය තේරුම් ගත අතර මට උදව් කළා. මෙයින් පසු, මම 2021 නොවැම්බර් මාසයේදී මගේ හෝමෝන ප්‍රතිකාරය ලබා ගැනීම සඳහා මඩකලපුව රජයේ රෝහලට මම ගියා. එහිදී මාව පරීක්‍ෂා කළ තැනැත්තා මට කීවේ ඔහුට මගේ දෙමාපියන් හමුවිය යුතු බවත් මේ සඳහා පරීක්‍ෂණයක් කළ හැකි බවත්. ඔවුන්ගේ උපදෙස් අනුව මගේ දෙමාපියන් වෛද්‍යවරයා හමුවූ විට ඔහු සඳහන් කළේ මට මානසික රෝගයක් තිබෙන බවත් මගේ කැමැත්තට ඉඩ ලබා නොදිය යුතු බවත්ය. මෙයින් පසු, මගේ දෙමාපියන් මට නැවත විරුද්ධ වීමට පටන් ගත්තා. මේ නිසා මම නැවතත් වඩාත් අවදානම් තත්වයකට ලක් වුනා. කෙසේ නමුත් මම මගේ ප්‍රතිකාර ලබා ගැනීමට මම රෝහලට ඇතුළත් වුවත් එම කාලය තුල කිසිම කෙනෙක් මාව පරීක්ෂා කළේ නැහැ. දිනපතා වෛද්‍යවරයා ඔයාට දැන් සනීපද ලෙස මගෙන් විමසුවත් මාව කිසිදු පරික්ෂාවකට ලක් කරේ නැහැ. එමෙන්ම ඔවුන් මාව ඇතුලත් කරේ පිරිමි වාට්ටුවටයි. එය කිසිසෙත් මට සුදුසු දෙයක් වුනේ නැහැ. මේ නිසා මගේ අභිමානයට ඇති අයිතිය සහ මගේ අනන්‍යතාවයට ඇති අයිතිය නැතිවෙලා කියලා මට හිතුණා. මම කවදාවත් කිසිම කෙනෙක්ට මඩකලපුව රෝහල නිර්දේශ කරන්නේ නැහැ. මම දැන් වෙනත් රෝහලක මගේ ප්‍රතිකාර කරගෙන යනවා.

**යොමුව 09: ත්‍රිකුණාමලය මහා රෝහලේ සිද්ධිය**

මම සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක්. වයස අවුරුදු 26 දී මම උණ රෝගයක් හේතුවෙන් 2021 නොවැම්බර් 20 සිට 25 දක්වා ත්‍රිකුණාමලයේ මහා රෝහලට මාව ඇතුළත් කළා. මෙහිදී මාව ඇතුළත් කළේ පිරිමි වාට්ටුවකටයි. නමුත් මට මාව කාන්තාවක් ලෙස දැනුනු නිසා මම වෛද්‍යවරයාට මේ සම්බන්ධව පැහැදිලි කළා. නුමුත් එතැනදී ඔවුන් එය සුළු ගැටළුවක් ලෙස සලකා බැහැර කළා. මෙම නිසා මම වැසිකිලියට යාමේදී, නාන්න යාමේදී අපහසුතාවයට විවිධ හිංසනයන්ට මුහුණ දුන්නා. එක් වරක් මම නාන්න යන විට මම කවුද කියලා දැනගන්න මිනිහෙක් මාව පිටිපස්සෙන් බදා ගත්තා. මම බියට පත්වෙලා හයියෙන් කෑගහගෙන පිටතට ආවත් කිසිවකුට සිදුවූයේ කුමක්දැයි දැන ගැනීමට අවශ්‍ය වුනේ නැහැ. එම කාලය තුළ මට තවත් රෝගියෙකු සමග ඇඳ බෙදාගන්න සිදු වුනා. මෙම තත්වය තුළ, මගේ අභිමානය සහ මගේ රහස්‍යභාවය පවත්වාගෙන යාමට ඇති අයිතිය මට අහිමි වුනා.

**යොමුව 10: ත්‍රිකුණාමලයේ සිද්ධිය**

මගේ මිතුරිය (සංක්‍රාන්ති සමාජභාවීය වයස අවුරුදු 24) 2019 වසරේදී මහා මාර්ගයේ කතා කරමින් සිටියදී ලිංගික අතවරයකට ලක් වුනා. මේ සිදුවීම නිසා ඇයගේ ලේ වහනයක් සිදු වුනා. සිදුවීම වාර්තා කිරීමට ඇය ත්‍රිකුණාමලය පොලිසියට ගොස් තිබුනා. මෙහිදී පොලිසිය විසින් ඇයගේ පැමිණිල්ල බාර නොගෙන තිබුන අතර ඇයගේ දුරකථන අංකය පමණක් ලබා ගෙන තිබුනා. ඇය ප්‍රතිකාර ලබා ගැනීමට රෝහලට ගිය විට එහිදී ඇයගේ දෙමව්පියන් පැමිණෙන තෙක් හිඳ ඇයට ප්‍රතිකාර ලබා දී තිබුනා. නමුත් රෝහලේ දීත් ඇයව නාම ලේඛනයේ සඳහන් කරන විට ඇය කාන්තාවක්ද පුරුෂයෙක්ද යන ගැටලුව ඔවුන්ට මතුවී තිබුනා. මගේ මිතුරිය පැවසුවේ පසුව පොලිසිය ඇයට ඇමතුමක් ලබාගෙන පරුෂ ලෙස බැණ වැදුන බවයි.

**යොමුව 11: ගෘහස්ත හිංසනය**

මට ඕන වුණේ රූපලාවන්‍ය ශිල්පී පාඨමාලාවක් හදාරන්න. මම පාඨමාලාව කරන්න ලෑස්ති වෙද්දි අම්මයි, අයියලගෙයි නෑදෑයොයි, අසල්වැසියොයි හැමෝම මට විරුද්ධ වුණා මම ගෑනු ළමයෙක් විදියට වෙනස් වෙනවා, අපේ කීර්තිනාමය නැති වෙනවා කියලා. 2019 ඔක්තොම්බර් මාසේ මාස 6ක පුහුණුවක් තිබ්බා මාස 06ක් ගියාට පස්සේ එයාලා මගේ ටීචර් එක්ක කතා කරලා කිව්වා මම මින්පසු මේ පුහුණුව කරගෙන යන්නෙ නෑ ඒක අනවශ්‍ය පුහුණුවක් කියලා ඊට පස්සේ අම්මා මම කිරිල්ලියක් වගේ එකතු කරපු හැම දේම කඩලා දැම්මා. ඒ තත්ත්වය තුළ මට දුක හිතුණා. කිසිවෙක් මා අසල නොමැති විට මගේ මිතුරන් ඒ පුහුණුව දිගටම කරගෙන යන්න කියලා මට බල කරා. 2019 ඔක්තෝබර් සිට 2020 මැයි දක්වා කාලය මේ නිසා මට ඉතා දුෂ්කර කාලයක් වුනා.

**යොමුව 12: ත්‍රිකුණාමලය පොලිස් ස්ථානයේ පොලිස් ප්‍රචණ්ඩත්වය**

"අපේ ජීවිතය අරගලයක්" සහාභාගී වූ පුද්ගලයා ප්‍රකාශ කළා. අපේ කණ්ඩායමේ 6 දෙනෙක් ඉන්නවා. ගිය අවුරුද්දේ 2021 නොවැම්බර් මාසේ හවස 6.30 ට විතර අපි 6 දෙනෙක් මුහුදුබඩ පැත්තේ ඉද්දි (තොල් ආලේපන ගාමින්) පොලිස් නිරීක්ෂක ජීප් රථයක් ආවා. ත්‍රිකුණාමලය පොලිසියේ නිලධාරීන් අපිව අල්ලාගෙන අපේ දුරකථන ගත්තා. පොලිස් නිලධාරීන් අපිව දැකලා කිව්වා අපිත් එක්ක නිදාගන්න එනවද කියලා? පසුව ඔවුන් අපට වධ හිංසා කළා (ගීත ගායනා කිරීම සහ අපේ අත් අල්ලාගෙන නටමින්). ඔවුන් ඔවුන්ගේ කලිසම් සිප් ගලවා ඉතා නරක විදිහට අප ඉදිරියේ හැසිරුනා. පැය 3කට විතර පස්සේ අපිව නිදහස් කළා.

**යොමුව 13: පොලිස් නිලධාරීන් තම බලය අයුතු ලෙස භාවිතා කිරීම**

2020.05.17 වන දින සියඹලාපේ ඇවිදින මන්තිරුවකදී 32 හැවිරිදි සමරිසි පුද්ගලයෙකු අසත්‍ය චෝදනා මත පොලිස් නිලධාරීන් තිදෙනෙකු විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර එම පුද්ගලයා ලිංගික අපයෝජනයට ලක් කර සමලිංගික යැයි ප්‍රචාරය කරන ඇත.

**යොමුව 14: සමලිංගික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වෛද්‍යවරයාගේ ආකල්පය**

2020.01.27 වන දින ගම්පහ - මීගමුව ලිංගාශ්‍රිත රෝග සායනයේදී 28 හැවිරිදි සමරිසි පුද්ගලයෙකුට එහි වෛද්‍යවරයා විසින් "පොන්නයා, උඹ දිගටම සමලිංගික වුනොත් උඹට එච්.අයි.වී හැදෙනවා " යනුවෙන් වාචික හිංසනයට භාජනය කර ඇත.

**යොමුව 15: මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ බලය අනිසි ලෙස භාවිතා කිරීම**

25 හැවිරිදි සංක්‍රාන්ති සාමජභාවිය කාන්තාවක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ ලිංගික අපයෝජනයට ලක් වූ අතර කොවිඩ් වසංගතය අතරතුර ඇගේ රූපලාවණ්‍යාගාරයේ තත්ත්ව සහ එහි ආරක්ෂිතභාවය පිළිබඳ වාර්තා නිකුත් කිරීමට ඇයගෙන් අල්ලස් ද ඉල්ලා ඇත.

**යොමුව 16: සංක්‍රාන්ති සමජභාවි පුද්ගලයන් සම්බන්ධව වෛද්‍යවරයාගේ මතය**

මඩකලපුව - යාපනය ශික්ෂණ රෝහලේ උපදේශක අන්තරාසර්ග වෛද්‍යවරයා 2020.03.20 වැනි දින රෝහල් නිරීක්ෂණය අතරතුර අවුරුදු 27ක් වන සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවකට ඇයගේ දෙමාපියන්ට තමා හමුවන ලෙස පවසා එහිදී ඇයට අනන්‍යතාවය වෙනස් කරගැනීමට ඉඩලබා දුන්නේ ඇයි දැයි විමසමින් ඇයගේ පියාට බැණ වැදී තිබුනා.

**යොමුව 17: පොලිස් නිලධාරීන් තම බලය අයුතු ලෙස භාවිතා කිරීම**

2021.10.4 දින 27 හැවිරිදි සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක්ට ඇගේ අනන්‍යතාවය හේතුවෙන් ඇයගේ අසල්වැසියා සමඟ බහින් බස් වීමක් පැවතුනි. වරක් ඇය ගාල්ල - අම්බලන්ගොඩ පොලිසියට මේ සම්බන්ධව පැමිණිල්ලක් කිරීමට ගිය අවස්ථාවේදී පොලිස් නිලධාරියා ඇයට බැන වැදී ඇත්තේ මින් මතුවට "පොන්න නඩු" ගේන්න එපා යැයි පවසමිනි. එමෙන්ම ඇයට අඳින පළඳින විදිහ වෙනස් කරගෙන පිරිමියෙක් වගේ ඉන්න කියලා ද ඔහු පවසා ඇත.

**යොමුව 18: ගාල්ල ජයවර්ධනපුර රෝහලේ සිද්ධිය**

2022.03.25 වන දින, 4 වන වාට්ටුවේ රාජකාරියේ නියුතු ප්‍රධාන හෙදිය සහ හෙදියන් විසින් සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවකට (වයස අවුරුදු 22) කිසිඳු අමුත්තෙකු හට පැමිණීමට ඉඩ දී නොමැත. ඇය තම ලිංගික අවයව ප්‍රතිස්ථාපනය කිරීමේ සැත්කම (Bottom Surgery) සඳහා යොමු වී තිබූ අතර රෝගියා නුගත් අයකු ලෙස එම හෙදියන් හඳුන්වා ඇති බවත් සැත්කම අනවශ්‍ය සැත්කමක් බව පවසමින් වාට්ටුවේ අනෙකුත් සියලුම රෝගීන් සහ කාර්ය මණ්ඩලය ඉදිරියේ උස් හඬින් කතාකර ඇයව අපහසුතාවට පත් කර ඇත.

**යොමුව 19: කොළඹ ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ සිදුවීම**

2021 මැයි මාසයේදී, NIMH මනෝචිකිත්සක වාට්ටුවේ වෛද්‍ය කපිල සහ ඔහුගේ කනිෂ්ඨ වෛද්‍යවරු, වයස අවුරුදු 27 ක සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවකට තම අනන්‍යතා සහතිකය ලබා ගැනීමට ගිය විට, සංක්‍රාන්තිය වීමට තෝරා ගැනීම සම්බන්දව ගැන චෝදනා කරමින් ඇයව වින්දිතයෙක් ලෙස සලකා ඇත. ඔවුන් ඇයව මානසික රෝගියෙක්, වංචාකාරියක්, අපරාධකාරියක් ලෙස හඳුන්වමින්, ඇයගේ පරම්පරාව හා චරිතය වැනි සංක්‍රාන්ති ක්‍රියාවලීන්ට සම්බන්ධ නැති අනවශ්‍ය පුද්ගලික ප්‍රශ්න ඇගෙන් අසා ඇත.

**යොමුව 20: වින්දිතයාගේ නිවසේ සිදුවීම**

2022.03.22 දින, වින්දිතයා සහ ඇගේ අසල්වැසියා අතර ඇති වූ ආරවුලක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් පරීක්ෂා කිරීමට වින්දිතයාගේ (වයස අවුරුදු 31 කාන්තා) පදිංචි ස්ථානයට පැමිණි පොලිස් කොස්තාපල්වරයා ඇයට මුහුණ පෑමට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් පිහිට පතා කළ ඉල්ලීම නොසලකා හැර ඇත. පොලිස් කොස්තාපල්වරයා වින්දිතයාගේ බාහිර පෙනුම

කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඇයට විවිධ නම් කියා තර්ජනය කර පවුලේ අය, අසල්වැසියන් සහ මිතුරන් ඉදිරියේ ඇයව අවමන් කර ඇත.

**නඩුව 21: කොළඹ මරීනා වෙළඳ සංකීර්ණය (Marina Mall) ඉදිරිපිට වූ සිදුවීම**

2022.03.18 වන දින, උපත් පාලන කොපුවක් තමා ලග තබා ගැනීමේ පදනම මත වින්දිතයා (අවුරුදු 28 ක සංක්‍රාන්ති සමාජභාවිය කාන්තාව) රිමාන්ඩ් කරනු ලැබීය. ඇයව රිමාන්ඩ් භාරයට ගෙන යන විට ඇයව පිරිමි සිර රැඳවුමකට යොමු කර ඇත. මෙහිදී වින්දිත කාන්තාව ඇය කාන්තාවක් බව පැහැදිළි කළ විට පොලිස් නිලධාරිනියන් ඇයව වැසිකිලියට රැගෙන ගොස් ඇඳුම් ගලවන ලෙස පවසා ඇගේ සිරුර (ලිංගික අවයව ඇති ප්‍රදේශයේ) පරීක්ෂා කර ඇය ඇත්තටම කාන්තාවක් දැයි පරීක්ෂා කර ඇත. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදීත් ඇයට නින්දා අපහාස කර ඇත.

**යොමුව 22: කරෙයිතිව්හි සිද්ධිය**

2021.11.20 දින, 6 දෙනෙකු විසින් තමන්ට පහරදීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට ගිය අවස්ථාවේදී, කරෙයිතිව්, අම්පාර පොලිස් ස්ථානයේ එක් පොලිස් නිලධාරියෙකු වින්දිතයාට (අවුරුදු 29 වන සංක්‍රාන්තිසමාජභාවීය කාන්තා) ගෞරවයෙන් සැලකුවේ නැති බව ප්‍රකාශ කළේය. ඇයව අනතුරට පත් කර ඇයට පහර දුන් අපරාධකරුවන්ගේ ලිපිනයන් සමඟ නැවත පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස පොලිස් නිලධාරීන් සඳහන් කර තිබිණි. ඇය බොහෝ අපහසුතා මැද එම ලිපිනය ලබා ගත් විට, පොලිසියට අවශ්‍ය වූයේ අපරාධකරුවන් එකම ආගමේ (ඉස්ලාම්) සහ නගරයේ යන පදනම මත ඔවුන්ට සමාව දීමටය. වින්දිතයා නීතීඥයකුගේ ලිපියක් පොලිස් ස්ථානයට භාර දුන් නමුත් පොලිසිය ඇයගේ පැමිණිල්ල ලියා තිබුණේ නැත.

**යොමුව 23: සමරිසි ප්‍රජාවේ පුද්ගලයෙකු වන මොහමඩ් ෆාතිමා (වයස: 18) ගේ සිද්ධිය**

අපේ අසල්වැසියෙක් වෙන ගැහැණු ළමයෙක් සමග මට සම්බන්ධයක් තියෙනවා. අපේ සම්බන්ධය ගැන අපේ දෙමාපියන් දැනගත් විට ඔවුන් අපට එකිනෙකා බැලීමට හෝ අවම වශයෙන් නිවසින් පිටතට යාමට ඉඩ දුන්නේ නැහැ. මගේ අම්මයි තාත්තයි මට හොඳටම ගැහුවා, විශේෂයෙන්ම මගේ අම්මා මට ගොඩක් වෛර කළා, මම පවුලේ නම විනාශ කරනවා කියලා මට බැන්නා. මට ගෙදරින් පැනලා යන්න බැරි වෙන්න තාත්තා මගේ ජාතික හැඳුනුම්පත හැංගුවා. අපි ගෙවල්වලින් පැනලා යන්න හදලා අම්මටයි අක්කටයි අහුවුණා. 2021.12.06 දින ඔවුන් අපව ඇදගෙන වත්තල පොලිසියට ගෙන ගිය අතර පොලිසියේ ඇති වූ බහින්බස් වීම හේතුවෙන් ස්ථානාධිපතිවරයා මාව රිමාන්ඩ් කූඩුවේ දමා පැය කිහිපයක් එහි රඳවා තැබුවා. එය මගේ ජීවිතය බවත් මට තීරණ ගැනීමේ අයිතිය ඇති බවත් පවසමින් මම මගේ පවුලේ අය සමඟ දිගටම වාද කළා. පොලිසියට මාව රැඳවුම් මැදිරියේරඳවා ගැනීමට නොහැකි වූ නිසා මම ප්‍රචණ්ඩකාරී ලෙස ක්‍රියා කළ බව කියමින් මාව රාගම රෝහලට ගෙන යන බව කිව්වා. පොලිස් ජීප් රථයක් ලෑස්ති කර ඔවුන් මාව, මගේ මව, සහෝදරිය සහ මගේ සහකාරිය සමඟ රෝහලට ගෙන ගියා, පොලිසිය මාව බාහිර රෝගී අංශයට භාර දුන් නිසා රෝහලේ සේවකයන් මාව මානසික රෝග වාට්ටුවට මාරු කළා. රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මගේ මව සහ සහෝදරිය මගේ සහකාරිය ඇයගේ නිවසට ගොස් ඔවුන්ට භාර දී තිබුනා. පසුව මට දැනගන්නට ලැබුණේ ඇය කාමරයක් තුළ සිරකර ඇති බවත් කිසිදු සන්නිවේදන ක්‍රමයක් සඳහා ඇයට ප්‍රවේශයක් ලබා දී නොමැති බවත්. මාව රාත්‍රිය පුරාවටම රෝහලේ රඳවාගෙන සිටි අතර වාසනාවකට මෙන් උදෑසන පැමිණි වෛද්‍යවරයා මට පැවසුවේ මා ඇතුළත් කිරීමට හේතුව සමරිසි වීම නිසා බවත් මට අසනීපයක් නොමැති බවත් ය. කෙසේ වෙතත්, මගේ නිවසේ ඇති

වූ ප්‍රශ්න හේතුවෙන්, මාව නිදහස් කිරීමට වෛද්‍යවරයා සැලකිලිමත් වූ බැවින්, 2021.12.07 දින ඇය ඉක්විටි ශ්‍රී ලංකා ආයතනය සම්බන්ධ කරගත්තා. සංවිධානය එදිනම මා හමුවීමට පැමිණි අතර පසුදින මා රෝහලෙන් පිටවීමට කටයුතු සම්පාදනය කළා. පවුලෙන් ස්වේච්ඡාවෙන් වෙන්වීම සම්බන්ධයෙන් නීතිඥවරයකු සමඟ වත්තල පොලිසියේ පොලිස් ප්‍රවේශයක් ද ගොනු කරා. මට වයස අවුරුදු 18 යි. සංවිධානය විසින් යොමු කළ නීතිඥයෙකු සමඟ මම පොලිසිය ඇතුලට ගියත්, පොලිසිය මගේ මව පොලිසියට කැදෙව්වා. ඔවුන් සිතුවේ මා තවදුරටත් සමරිසි නොවන ලෙස මාව නිවැරදි කිරීමට සංවිධානය මට උදව් කරන බවයි. කෙසේ වෙතත්, පොලිසියේ සටහන යොමු කිරීමෙන් පසු මම මගේ නිවසින් බැහැරව සිටි අතර මගේ අනාගතය ගොඩනගා ගැනීම සඳහා ඉක්විටි ශ්‍රී ලංකා ආයතනය වෙතින් සේවාවන් ලබා ගත්තා.

**යොමුව 24: සමරිසි ප්‍රජාවේ පුද්ගලයෙකු වන නදුන් පෙරේරා (වයස: 19) ගේ සිද්ධිය**

විශ්ව 2022 උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුවෙකි. ඔහු මේ වන විටත් තම ලිංගික දිශානතිය ගැන පිටතට පැමිණ ඇති බැවින්, ප්‍රධාන වශයෙන්ම ඔහුගේ පුද්ගලික සමාජ මාධ්‍ය ගිණුමේ හුවමාරු වන ලිපිය සහ පෝස්ට් නිසා ඔහුට පාසලේදී, කෑගල්ල ශාන්ත මරියා විද්‍යාලයේදී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු විය. කෑගල්ල ශාන්ත මරියා විද්‍යාලයේ ආචාර්යවරුන් තීරණය කර ඇත්තේ පාසල් ශිෂ්‍ය නායකයින් යොදා ගනිමින් කමිටුවක් පත් කර මෙම ගැටළුව විසඳීමටයි. විශ්වට පහර දී, එවැනි හැසිරීම් නතර කරන ලෙස තර්ජනය කර, ඔහු සාමාජිකත්වය දරන විවිධ පාසල් සමාජවල සභාපතිවරුන්ගේ බලපෑමෙන් ඔහුට පාසලෙන් ඉවත් වන ලෙස බලකරමින් විශ්වගේ ක්‍රියාව නැවැත්වීමට කමිටුව තීරණය කර ඇත. විශ්ව ගමේ පොඩි පාසලක සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගෙන මෙම පාසලට ගිය නිසා පාසලේ නම නරක් නොකර පාසලෙන් අයින් වෙලා ආපු තැනට යන්න යැයි පවසා තිබුනා. LGBTI ප්‍රජාවට අයත් තවත් සිසුන් දෙදෙනෙකු සිටි බැවින් විශ්ව මෙම තීරණය සම්බන්ධව ඔවුනට කතා කිරීමට උත්සාහ ගත්තත් එය නිෂ්ඵල වී ඇත. විශ්වට පාසලෙන් ඉවත් වන ලෙසට කමිටුව තීරණය කර ඇති අතර ඔහු වෙනුවෙන් පාසලට ද පෙත්සමක් පැමිණ තිබේ. පාසලේ එක් ගුරුවරියක් විශ්වගේ මවට පාසලට එන ලෙස දන්වා ඇති අතර විශ්ව සහ ඔහුගේ මව දෙදෙනාටම අපහසුතාවයක් ඇති කිරීම සඳහා පෙත්සම හයියෙන් කියවා ඇත. මෙම ගැටළුව 2022 දී ආරම්භ වූ අතර කොරෝනා හේතුවෙන් අන්තර්ජාලය හරහා ඉගැන්වීම් සිදු කළ බැවින් මෙම ගැටළුව විසඳීමට පාසලෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

**යොමුව 25: උපදේශිකා අමා දිසානායක මහත්මිය විසින් මහනුවර පොලිස් ස්ථානයේ සිදු කරන ලද සමලිංගික සැසිය පිළිබඳ වාර්තා වූ සිදුවීම**

මූලාශ්‍රය: 2021.07.08 දින Daily FT
https://www.ft.lk/news/Court-of-Appeal-allows-Equal-Ground-others-to-serve-notice-to-Police-Ama-Dissanayake-over-homophobic-training/56-726059

මහනුවර සහ මාතලේ පොලිස් නිලධාරීන් සඳහා මහනුවර පොලිස් ශ්‍රවණාගාරයේදී පුහුණු වැඩසටහනක් පැවැත්වූ උපදේශක සහ පුහුණුකරු අමා දිසානායක යන අය ශ්‍රී ලංකාවේ සමරිසි, ද්විරිසි , සංක්‍රාන්ති සමාජභාවිය, අන්තර් ලිංගික, සහ Queer/Questioning (LGBTIQ) ප්‍රජාවේ අයිතීන් කඩකිරීම සහ වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් පොලිස්පති සී.ඩී.වික්‍රමරත්නට, මහනුවර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පොලිස්පති චන්දන අලහකෝන්ට නොතීසි නිකුත් කිරීමට අභියාචනාධිකරණය අවසර ලබා දී තිබේ.

සෝභිත රාජකරුණා සහ විනිසුරු ධම්මික ගනේපොල යන ද්විපුද්ගල විනිසුරු මඩුල්ලක් හමුවේ මෙම පෙත්සම සළකා බැලීය.

LGBTIQ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ශ්‍රී ලංකාවේ පැරණිතම සංවිධානය වන Equal Ground, වෙනත් අය සමඟින් අභියාචනාධිකරණයට පෙත්සමක් ගොනු කර ඇත්තේ, LGBTIQ ප්‍රජාව පිළිබඳව ද්වේශසහගත, වැරදි සහ වෙනස් කොට සැලකීමේ ප්‍රකාශ සිදු කරමින් පොලිසිය සඳහා මෙම පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා ඉහත සඳහන් වගඋත්තරකරුවන්ට එරෙහිව තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසයි.

2021 ජූලි මාසයේ පැවති පුහුණු වැඩසටහනේදී දිසානායක කියා සිටියේ ශ්‍රී ලංකාවේ සමලිංගිකයන් අන් අයව, විශේෂයෙන්ම තරුණ තරුණියන්ව, ඔවුන් LGBTIQ ප්‍රජාවේ කොටසක් බවට පත් කිරීමට උත්සාහ කරන බවයි. LGBTIQ වීම අස්වාභාවික බවත් එය ජීව විද්‍යාත්මක සහ සමාජ සම්මතයන්ට පටහැනි බවත් එවැනි සබඳතා ප්‍රජනනයට හේතු නොවන බවත් ඇය ප්‍රකාශ කළාය. ඉන්පසුව ඇය සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටියේ ඔවුන්ද එවැනි සබඳතාවලට විරුද්ධ බව හයියෙන් හඬ නගන ලෙසයි.

ශ්‍රී ලංකාවේ LGBTIQ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් කොන් කරන සහ උල්ලංඝනය කරන පුහුණුවීම්, දේශන, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීමෙන් ශ්‍රී ලංකා පොලිසිය වළක්වන තහනම් ආඥාවක් පෙත්සම්කරුවන් ඉල්ලා සිටියි. නීතිය බලාත්මක කිරීම මගින් විවිධ ලිංගික දිශානති සහ ස්ත්‍රී පුරුෂ භාවය හඳුනාගැනීම්/ප්‍රකාශනය සහිත පුද්ගලයන් අපහාස කිරීම, අමානුෂිකකරණය කිරීම සහ හෙළා දැකීම සඳහා අවසර දීම සහ අනුමත කිරීම මූලික මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල නොවන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමකි.

ශ්‍රී ලංකාවේ LGBTIQ ජනගහනයට වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් සංවිධානයක් විසින් නීතිය ක්‍රියාත්මක කිරීමට අභියෝග කරන ලද මෙවැනි නඩුවක් ගොනු කරන ලද පළමු අවස්ථාව මෙය වේ.

ශ්‍රී ලංකාවේ LGBTIQ අනන්‍යතා සිතියම්ගත කිරීම පිළිබඳ Equal Ground හි පර්යේෂණ (2021) පෙන්නුම් කරන්නේ වැඩිහිටි ජනගහනයෙන් (අවුරුදු 18-65) 12% ක් හෝ ශ්‍රී ලංකාවේ පුද්ගලයින් 1,469,574 LGBTIQ ලෙස හඳුනාගෙන ඇති බවයි. මේ අතර, ශ්‍රී ලංකා පොලිසියේ සමරිසි සහ සංක්‍රාන්ති භීතිකාව පිළිබඳ ලේඛනගත සාක්ෂි තිබේ. මෙම සන්දර්භය තුළ, එවැනි පුහුණුවීම් පැවැත්වීමෙන් සිදුවන්නේ ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ තවමත් පවතින පුරාණ, යටත් විජිත නීති හේතුවෙන් LGBTIQ ප්‍රජාව මුහුණ දෙන වෙනස්කම් කිරීම් සහ ප්‍රචණ්ඩත්වය උග්‍ර වීම පමණි.

සමරිසි වීම මානසික/ශාරීරික රෝගයක්/අක්‍රමිකතාවක් හෝ අසාමාන්‍ය දෙයක් බවට කරන ලද සාවද්‍ය ප්‍රකාශය හෙළා දකිමින් ශ්‍රී ලංකා මනෝ චිකිත්සකවරුන්ගේ විද්‍යාලය (SLCP) පුහුණුවීම්වලදී දිසානායකගේ ප්‍රකාශයන් පිළිබඳ Equal Ground ගේ ලිපියට ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ "නූතන මනෝ වෛද්‍යවරුන් සමරිසි භාවය මානසික රෝගයක් ලෙස හඳුනාගෙන හෝ එයට ප්‍රතිකාර කරන්නේ නැති බවයි. සමරිසි භාවය මානසික රෝගයක් යන මෙම මිථ්‍යාව අපගේ සාමාජිකත්වය විසින් ක්‍රියාත්මක කරන සාක්ෂි පදනම් කරගත් විද්‍යාවට නොගැලපෙන බවත් කැමැත්ත ඇති වැඩිහිටියන් අතර සමරිසි ලිංගික සම්බන්ධතා සාපරාධී ක්‍රියාවක් බවට පත් කරන පුරාණ නීති අහෝසි කරන ලෙස ද ඔවුන් බලධාරීන්ගෙන් දැඩි ලෙස ඉල්ලා සිටියහ.

පෙත්සම්කරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා පෙනී සිටියේය.

**යොමුව 26: කැගල්ල ශාන්ත මරියා විද්‍යාලයේ සිද්ධිය**

2018 වර්ෂයේදී කැගල්ල ශාන්ත මරියා විද්‍යාලයේ සිසුන් දෙදෙනෙකු (17 සහ 18) සබඳතාවක් ඇති බවට චෝදනා එල්ල වී පසුව ගුරුවරයෙකු විසින් සොයා ගන්නා ලද තොරතුරක් මත එය තහවුරු කර ගන්නා ලදී. පසුව ගුරුවරයා දෙමාපියන්ගේ රැස්වීමකට කැඳවා සියලු දෙමාපියන් ඉදිරියේ තමාට ලැබුණු ලිපිය කියවා ඇත. සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන් යන දෙපාර්ශවයම කාර්ය මණ්ඩලය සහ අනෙකුත් දෙමාපියන් ඉදිරියේ දැඩි ලෙස අපහසුතාවයට පත්ව ඇත. මෙම සිසුන් දෙදෙනා ජාතික මට්ටමේ තරගවලින් ජයග්‍රහණ රැසක් ගෙන ඇති නිසා ඔවුන්ව පාසලෙන් අස් කිරීමට ගුරුවරුන් සහ විදුහල්පතිවරයා ප්‍රතික්ෂේප කර තිබෙනවා. එහෙත් සිසුන් හා පාසලේ ආදි ශිෂ්‍ය සංගමයට සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවකට මෙම ගැටලුව කළමනාකරණය කිරීමට ඉඩ දීමට ආචාර්ය මණ්ඩලය එකඟ වී තිබෙනවා. මෙම පාර්ශවයන් විසින් සිසුන් දෙදෙනාට දැඩි ලෙස හිරිහැර කර ඇති අතර එම නිසා වයස අවුරුදු 17 ක සිසුවා සියදිවි නසා ගැනීමට උත්සාහ කර ඇත. අනෙක් සිසුවා ඔහු බැලීමට රෝහලට ගිය විට එය විශාල ප්‍රශ්නයක් වී ඇති අතර එම සිදුවීම පාසලට මෙන්ම දෙමාපියන්ටද ආරංචි වී ඇත. මේ නිසා රෝහල් ගත කළ සිසුවා සමලිංගිකයකු බැවින් ඔහු මානසික ආබාධයකින් පෙළෙන බවට ඔහු ප්‍රතිකාර ලැබූ රෝහල පොලිසියට පැමිණිලි කර ඇත. පසුව ඔහුව අංගොඩ මානසික රෝහලට මාරුකර යවා ඇත. මේ ප්‍රශ්න නිසා සිසුන් දෙදෙනාගේ සම්බන්ධය නතර කර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයක් විසින් අප වෙත වාර්තා කර තිබූ අතර මේ වන විට 18 හැවිරිදි සිසුවා ලිංගික සේවාවල නිරත වන බව පැවසෙන අතර අනෙක් සිසුවා සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නොමැති බවද ප්‍රකාශ කළා.

**යොමුව 27: පැලියගොඩ සිදුවීම**

සමන්ති 28 හැවිරිදි සමරිසි කාන්තාවකි. ඇය වෙනත් කාන්තාවක් සමඟ ඇති සම්බන්ධය වටහා ගැනීමත් සමඟ ඇගේ පවුලේ අය ඇයට හිරිහැර කර ඇත. ඒ නිසා ඇය තම පවුලෙන් වෙන් වී තනිව ජීවත් වීමට පටන් ගෙන ඇත. සමන්තිගේ පවුලේ අය මේ පිළිබඳව පැලියගොඩ පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත. 2022 මැයි මාසයේදී, පොලිසිය ලබා දුන් උපදෙස් අනුව ඔවුන් ඇයට සමාව දුන් බවට ප්‍රකාශ කරමින් ඇයව නිවසට ගෙන්වාගෙන ඇති අතර පසුව ඇයව නිවසේ සිරකර තබා සියලු සන්නිවේදනයෙන් ඉවත් කර ඇත. ප්‍රජා සංවිධානයක සහාය ඇතිව ඇයගේ සහකාරිය මාකොළ පොලිස් ස්ථානයේ කාන්තා හා ළමා කාර්යාංශය සමඟ සම්බන්ධ වීමට සමත් වී ඇත. මාකොළ පොලිස් ස්ථානයේ නිලධාරීන් එම පුද්ගලයන්ට ඉමහත් ලෙස උපකාර කර කර ඇති අතර ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ එම පුද්ගලයන් අවුරුදු 18ට වැඩි බැවින් ඔවුන්ට වෙනම ජීවත් විය හැකි බවත් පවුලේ අයට එයට විරුද්ධ විය නොහැකි බවත්ය. එම නිසා මෙම පුද්ගලයන් දෙදෙනාට වෙනම නිවසක ජීවත් විය හැකි නමුත් පැලියගොඩ පොලිස් ස්ථානය දෙමාපියන්ට සහය දක්වන බැවින් ඔවුන්ට තවමත් ප්‍රශ්න කිරීම් වලට, පොලිසියෙන් අවවාද කිරීම් සහ පවුලේ අයගෙන් දිගින් දිගටම හිරිහැර සිදුවන බව ඔවුන් ප්‍රකාශ සිටියහ.

**යොමුව 28: නච්චි ප්‍රජාවේ පුද්ගලයෙකු වන ලකී (වයස 33) ගේ සිද්ධිය.**

2020 ජුලි මාසයේ අම්බලන්ගොඩට කිට්ටු පෙරහැරක නටලා ඉවර වෙද්දි පරක්කු වුනා. ඇඳුම් මාරු කරගත්තත් මේකප් එක ඉවත් කරන්න වෙලාවක් තිබුණේ නැහැ. පරක්කු වෙන නිසා මාතර යන බස් එකකට නැගලා බූස්ස හන්දියෙන් බැස්සා. මම බසයෙන් බසින විට පොලිසියේ තිදෙනෙක් හෝල්ට් එක අසල සිටගෙන හිටියා. මම ඔවුන් දෙස නොබලා පාර මාරු වී මගේ නිවස දෙසට ඇවිද ගියා. ඔවුන් මා පසුපස එන බව මට වැටහුනා. මම වේගයෙන් යන්න පටන් ගත්තා. එවිට ඔවුන්ගෙන් එක් අයෙක් "ඒයි" කීවේය. මම ආපසු නොබලා දිව්වා. එක්කෙනෙක් මාව එළෙව්වා. මම පුළුවන් තරම් වේගයෙන් දිව්වා. ඊට පස්සේ අනිත් දෙන්නා බයික් එකට නැගලා ආව නිසා මාව අල්ලගන්න පුළුවන් වුණා. මගේ පස්සෙන් එන රාළහාමි මාව ලයිට්

කණුවකට හේත්තු කරලා මගේ යටි බඩ මිරිකුවා. "මොකද පොන්නයා දුවන්නේ? උබ වේස කමේ යනවා නේද?" කියලා ඇහුවා. මම කිව්වා මම බය වෙලා දිව්වා කියලා. එයාලා හිනාවෙලා කිව්වා බෑග් එක ඇරලා පෙන්නන්න කියලා. බෑගයේ නැටුම් ඇඳුම් තිබුණා. පෙරහරකට කියලා මම කිව්වත් ඒ අය මාව විශ්වාස කළේ නැහැ. ඔවුන් කිව්වා මම පිරිමි ගණිකාවක් කියලා. ඔවුන් මගේ සාක්කු සියල්ල පරීක්ෂා කරලා දුරකථනයත් පරීක්ෂා කළා. මමයි තව පිරිමි කෙනෙකුයි අතර තිබුණු පණිවිඩ සංවාදය කියවලා නිලධාරියා කිව්වා මම පොන්නයෙක් කියලා. එකෙක් ඇහුවා මොකද කරන්නේ කියලා. සල්ලි කීයක් තියනවද කියලත් ඇහුවා. මගේ ගාව තිබුණේ 1500යි. ඒ මම නටලා හම්බ කරපු සල්ලි. මම කිව්වා දෙන්නම් මට යන්න දෙන්නම් කියලා. එක රාළහාමි කෙනෙක් අනිත් අයගෙන් ඇහුවා මොකද කරන්නේ කියලා. අපි ටිකක් විනෝද වෙමුද? අනිත් දෙන්නා කිව්වා මට ලිංගාශ්‍රිත රෝග තියෙන්න පුළුවන් කියලා. අපි හිරිහැර කරලා පොලිසියට ගෙනියමු කිව්වා. මාව පොලිසියට ගෙනියන්න එපා කියලා මම හයියෙන් කෑගැහුවා. ඊට පස්සේ මාව එළිය තියෙන තැනකට එක්කගෙන ගිහින් නටන්න කිව්වා. මම නැටුවා. එයා මට සින්දුවක් කියන්න ගමන් නටන්න කිව්වා. මම ශාන්ති කර්මයක් නැටුවා. ඒකට එයාලා විරුද්ධ වුණා. පොන්නයෙක් වගේ නටන්න කිව්වා. එක රාලහාමි කෙනෙක් ෆෝන් එකෙන් සින්දුවක් ඒ සින්දුවට මට නටන්න කිව්වා. මම විනාඩි දහයක් විතර නැටුවා ඊට පස්සේ කිව්වා යන්න නම් දාහක් දෙන්න කියලා. මම දාහක් දීලා එතනින් ගියා.

**යොමුව 29: හලාවතදී ආගමික නායකයෙකු අතර ඇතිවූ සිදුවීම**

රජරට ගැමිපහන සංවිධානයේ HIV මර්දන වැඩසටහන් ව්‍යාපෘතිය වන GFATM, පුත්තලම සහ හලාවත ප්‍රදේශයන්හී ක්‍රියාත්මක වේ. එහිදී ඔවුන් හලාවත සහ පුත්තලම ලිංගාශ්‍රිත රෝග සායන වෙත සහකරුවන් යොමු කරයි. එක් අවස්ථාවකදී හලාවත ලිංගාශ්‍රිත රෝග සායනයෙහි සේවය නියලෙන පුද්ගලයෙකු විසින් එම සායනයට පැමිණි ප්‍රජා සහකරුවන් කිහිප දෙනෙකුගේ තොරතුරු ලබාදී ඇත.

2020 වර්ෂයේදී හලාවත ලිංගාශ්‍රිත රෝග සායනයෙහි සේවය කරනු ලබන මුස්ලිම් ජාතික සේවකයෙකු විසින් මුස්ලිම් ජාතික පිරිමි ළමුන් මෙම පරීක්ෂණ සඳහා යොමු කර ඇතිබව එම ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියට දන්වා ඇත. එම ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියේ මව්ලවිතුමන් විසින් මෙයට මැදිහත්ව ලිංගාශ්‍රිත රෝග සායනයෙන් ලබාදෙන සේවාවන් නවත්වන ලෙස පවසමින් තර්ජන එල්ල කර ඇත. එමෙන්ම සංවිධානයට තර්ජන එල්ල කිරීම සඳහා මැරයන් යවා ඇති අතර මව්ලවිතුමන් එම සංවිධානයේ වැඩකටයුතු ගැන ප්‍රසිද්ධියේ විවේචනයට ලක් කරමින් ජනතාව අතර අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීමට උත්සහ කර ඇත. ඔහු මේ සම්බන්ධයෙන් හලාවත පොලිස් ස්ථානයට ද පැමිණිල්ලක් කර ඇති අතර එහි සංවිධාන කටයුතු සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණක් ද සිදු කර ඇත. රජ රට ගැමිපහන විසින් මෙම ගැටලුව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇතත් මව්ලවිවරුන්ගේ තර්ජන තවමත් පවතින බව ඔවුන් ප්‍රකාශ කරයි .

**යොමුව 30: බලහත්කාරයෙන් විවාහකරදීම**

දියතලාව ප්‍රදේශයේ පදිංචි 35 හැවිරිදි සමරිසි තරුණයෙකු ඔහුගේ ලිංගික දිශානතිය මත පවුලේ අය විසින් බලහත්කාරයෙන් විවාහ කර දී ඇත. පවුලේ අය ඔහුගේ ලිංගික දිශානතිය රෝගයක් ලෙස සලකා ඇති අතර ඔහුව විවාහකරදීමට වීමට පෙර සිටම ඔහු පවුලේ අයගෙන් දැඩි ලෙස හිරිහැරයට ලක්ව ඇත. එමෙන්ම ඔහුගේ රෝගය සුව කිරීමට විවිධ උපදේශකයින් සහ ගුරුකම් ආදී දෑ කරන පුද්ගලයින් වෙත රැගෙන ගොස් ඇත. දිගින් දිගටම එල්ල වන බලපෑම් සහ හිරිහැර හේතුවෙන් මෙම තරුණයා සියදිවි නසා ගැනීමට ද උත්සාහ කර ඇති අතර පසුව පවුලේ අය සතුටු කිරීම සඳහා විවාහ වීමට එකඟ වී ඇත. එහෙත් ඔහුගේ විවාහයෙන් පසුවද ඔහු සමරිසි සහකරුවන් සමග ලිංගික සම්බන්ධතා දිගටම පවත්වාගෙන

ගොස් ඇත. 2021 මැයි මාසයේදී ඔහුගේ බිරිඳ ඔහුගේ ලිංගික දිශානතිය ගැන දැනගෙන ඇති අතර ඇයට ඔහු සමඟ එකම වහලක් යට ජීවත් විය නොහැකි බව පවසමින් ඔහුගෙන් වෙන්වී ඇත. ඔහු මේ වන විට තම බිරිඳගෙන් වෙන්ව ජීවත් වන අතර තමාට මුහුණ දීමට සිදු වූ සිද්ධීන් හේතුවෙන් මානසිකව දැඩි ලෙස වෙහෙසට පත්ව සිටින බවයි ඔහු ප්‍රකාශ කළේය . තමාට ධනාත්මක සිතුවිලි නොමැති බවත් ජීවිතය පිළිබඳ විශ්වාසය සම්පූර්ණයෙන්ම නැති වී ඇති බවත් ඔහු පැවසීය.